


# අරුණ

2023 ජූලි 24 සඳුදා | හතර වැනි කාණ්ඩය | 250 කලාපය | මිල රු 60.00 | www.aruna.lk



පුවත්පත
නිවසටම ගෙන්වා ගැනීමට
දැන්ම අමතන්න : 0761 367 623
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න




# පච්ච නියාමනය කරන්න

## ඒඩ්ස් බෝවීමේ අවදානමක්

### ටැටූ සංගමය කියයි

■ අනීෂා මානගේ

පච්චා කොටන ආයතන නියාමනයට රජයේ කිසිදු අවධානයක් යොමු නොවීම සහ බොහෝ ආයතන නිසි ආරක්ෂක ක්‍රමවේද අනුගමනය නොකිරීම හේතුවෙන් ඒඩ්ස් ඇතුළු සමාජ රෝග සහ විවිධ ලෙඩ රෝග බෝවීමේ දැඩි අවදානමක් ඇතැයි ශ්‍රී ලංකා ටැටූ සංගමය සඳහන් කරයි.

02 පිටුවට

## ප්‍රකෝටිපතියන්ගේ

# සුපිරි ඉඩම්වලට හොර ඔප්පු හදන නොතාරිස්ලාට CID දැල

■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා

රට පුරා ඇති වටිනා ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සකස් කරන නොතාරිස්වරුන් සොයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශනයක් අරඹා ඇත.

02 පිටුවට



# අනුරාධපුරයට නව නීතියක් -ජනපති

05 පිටුවට



## ගතවූ වසර 7 ඇතුළත

# ප්‍රමිතියෙන් තොර ඖෂධ 587ක් ඉවතට

■ උදයජීව ඒකනායක

02 පිටුවට

## LTTE ප්‍රබලයන් දෙදෙනකුට

# ජනපති සමාව

### එක් අයෙක් වසර 200ක සිර දඬුවම් ලැබූවෙක්

■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා

වසර දෙසීයක සිර දඬුවම් නියම කර බන්ධනාගාරගතව සිටි මහ බැංකු බෝම්බ ප්‍රහාරයට චෝදනා ලැබූවකු හා ජීවිතාන්ත සිර දඬුවම් ලැබූ එල්ටීටීඊ ප්‍රබලයන් දෙදෙනකු ජනාධිපති සමාව යටතේ නිදහස් කළ බව බන්ධනාගාර දෙපාර්තමේන්තුව පවසයි.

02 පිටුවට

## අධිකාරියේ නිලධාරීන් අල්ලස් ගන්න නිසා

# කඩ වැටලීම් නවතනවා

### -වෙළෙඳ ඇමැති කියයි



■ චාමර පල්ලේගෙදර

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කරන වෙළෙඳසල් වැටලීම් නතර කිරීමට වෙළෙඳ ඇමැති නලින් ප්‍රනාන්දු තීරණය කර ඇත.

02 පිටුවට

## උපන් දින සාදයේ

# නිවසට ගිනි තබලා: තරුණියක් මරුට

### 9ක් රෝහලේ



ගිනි තැබූ නිවස



මියගිය තරුණිය

■ මාධව කුලසූරිය - වවුනියාව

වවුනියාව, තෝණිකල් ප්‍රදේශයේ උපන්දින සාදයක් පැවැත්වෙමින් තිබූ නිවසකට කිසියම් පිරිසක් ගිනි තැබීමෙන් එහි සිටි තරුණියක් මියගොස් තවත් පුද්ගලයන් 09 දෙනෙකු තුවාල ලබා වවුනියාව රෝහලට ඇතුළත් කොට ඇති බව වවුනියාව පොලිසිය පවසයි.

02 පිටුවට

# පඬුකරඳ ගස ගොඩගන්න නියෝග

05 පිටුවට

## මෙරට ව්‍යාපාරිකයන්ට තරු පෙන්වූ මැලේසියානුවා අල්ලයි

■ එෆ්. අස්ලම්

02 පිටුවට




## අතුරුදන් වූ මව හා දියණිය ගැන

# තවම තොරතුරක් නැහැ

■ කුමාර වික්‍රමආරච්චි - හේවාහැට

වයස අවුරුදු එකහමාරක දියණියද සමගින් දින හයක කාලයක් අතුරුදන්ව සිටින හඟුරන්කෙත කාන්තාව සම්බන්ධයෙන් මෙතෙක් නිශ්චිත තොරතුරක් නොමැති බව හඟුරන්කෙත පොලිසිය පවසයි.

02 පිටුවට

# පඬුකරඳ ගස් 100ක් දැනටම බෝ කරලා

## ගම්පහ තව මහ ගස් 7කුත්

05 පිටුවට





ආයෝජන සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වූ අඩු පොලී ණය

නව ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාර උපදේශනය සහ මූල්‍ය පහසුකම්

ආපදාවන්ට ලක්වී ඇති ව්‍යාපාර නැවත බලගැන්වීමට මූල්‍ය ප්‍රතිව්‍යුහකරණය

අපනයන ව්‍යාපාර දිරිගැන්වීමේ උපදේශනය සහ සිත්ගන්නා මූල්‍ය පහසුකම්

දැන්ම 0112 481608 / 0112 481356 / 0112 481426 අමතන්න,
නැත්නම් ළඟම මහජන බැංකු ශාඛාවට පිවිසෙන්න.

www.peoplesbank.lk
1961 PEOPLE'S BANK CALL CENTRE
PEOPLE'S BANK
Pride of the Nation

# ඇහැළ මහට දෙව්නුවරම එළිය කරන උපුල්වන් දෙවොලේ මහ පෙරහර


ආචාර්ය දෙව්නුවර සිරි සුනන්ද මහ නාහිමියෝ


පරම විචිත්‍රාරාම රාජමහා විහාරස්ථානය


බස්නායක නිලමේ තිළිණ මධුසංඛ


දේවාභරණ පෙරහරේ වඩම්මවන අයුරු

'දෙවිනුවර' යන නාමය අසෙනවාත් සමගම සැමගේ මතකයට එන්නේ ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලයයි. පළමුවැනි දප්පුල රජු විසින් ඉදිකරවන ලද මෙම දේවාලය වටා ගොඩනැගී ඇති ඓතිහාසික කථාන්තර රැසකි.

මෙරට ඉදිවූ පැරණිතම දේවාල අතුරින් එකක් සේ සැලකෙන දෙව්නුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය බුදුසසුන සුරකින උපුල්වන් දෙවියන් වෙනුවෙන් ඉදිකර තිබීම විශේෂත්වයකි. ඓතිහාසික සිදුවීම් රැසක තෝතැන්නක් වූ ශ්‍රී විෂ්ණු මහා දේවාලය වර්තමානයේ වඩාත් ජනප්‍රියවී ඇත්තේ වාර්ෂිකව පවත්වනු ලබන ඇසළ මහා පෙරහර මංගල්‍යය හේතුවෙනි.

මෙවර එහි ඇසළ පෙරහර මංගල්‍යය පවත්වනු ලබන්නේ 766 වැනි වරටය. මේ වන විට ඒ සඳහා සියලු කටයුතු සූදානම් කරමින් පවතී. උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ සිදුවන සෑම කටයුත්තකම ප්‍රධානත්වය හා භාරකාරත්වය දරන්නේ බස්නායක නිලමේවරයාය. දේවාලය හා දෙව්නුවර පුදබිම කේන්ද්‍ර කර ගනිමින් සුවිසල් සේවාවක් සිදුකිරීමට මෙම බලසම්පන්න තනතුරට ලැබී තිබෙන්නේ අපමණ ඉඩකි.

දෙව්නුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ වත්මන් බස්නායක නිලමේවරයා වන්නේ ආරච්චිගේ තිළිණ මධුශංකය. වෘත්තියෙන් ව්‍යාපාරිකයකු වූ ඔහු සිය ධුරයේ වැඩ භාරගෙන පළමු රාජකාරිය ලෙස සිදු කළේ දෙව්නුවර පරමවිචිත්‍රාරාම රාජ මහා විහාරාධිපති ශ්‍රී කල්‍යාණවංශ මහා නිකායේ මහනායක ආචාර්ය දෙව්නුවර සිරිසුනන්ද නාහිමියන්ගේ අනුශාසනා පරිදි සම්බුද්ධ පූජාව ආරම්භ කිරීමය. එයට ජනතාවගෙන් ලැබුණේ ඉහළ ප්‍රතිචාරයකි.

ඉන්පසු ඔහු සිදු කළේ හිටපු බස්නායක නිලමේවරයකු වූ ඩිෂාන් වික්‍රමරත්න ගුණසේකර විසින් ආරම්භකර ඉතා සාර්ථකව ක්‍රියාත්මක කළද, පසුව පරිහානියට පත්වෙමින් තිබූ 'හැපී කිඩ්ස්' පෙර පාසල ප්‍රතිසංවිධාන කිරීමය. මේ වන විට එය ප්‍රදේශයේ අසරණ දරුවන් සඳහා විශාල සේවාවක් කරන ස්ථානයක් බවට පත්ව ඇත. මේ සඳහා හිටපු ගුරු මධ්‍යස්ථාන කළමනාකාරවරියක වූ ශ්‍රීමතී අයිරාංගනී ලියනගේ ගෙන් ද මනා සහායක් ලැබී ඇත. අද වන විට එහි සේවා දරුවන්ට පමණක් නොවගුවරුවරුන් හා දෙමාපියන් වෙනුවෙන්ද ක්‍රියාත්මකය.

තිළිණ මධුශංක මහතා බස්නායක නිලමේ ධුරයට පත්වී මාස කිහිපයක් ගතවන විට දෙව්නුවරට පමණක් නොව අවට ප්‍රදේශවල පාසල්, පන්සල් හා විවිධ පුණ්‍ය ආයතන සඳහාත් දේවාලයෙන් ඉහළම දායකත්වය ලබා දුන්නේය. පාසල් දරුවන්ගේ අඩුපාඩු සකසාදීම සහ රෝගී සත්කාරක සේවාව ඒ අතර ප්‍රමුඛය.

එපමණක් නොව දේවාල භූමිය හා විහාරස්ථාන භූමිය කිසිදු අඩුපාඩුවක් සිදු නොවන ලෙස සකසා තිබේ. මදුරුවන්ට තෝතැන්නක් වී ජරාවාසව පැවැති අලි නාවන පොකුණ ප්‍රතිසංස්කරණය කර නැවත සකස්කිරීම ද ඉතාම වැදගත් කටයුත්තකි. දේවාල ඉතිහාසයේ ප්‍රථම වතාවට දේවාල පරිශ්‍රය මුල්කරගනිමින් QR කේත සහිත මුද්දරයක් හා මුල් දින කවරක් නිකුත් කිරීමද ඔහුගේ කාලයේ සිදුවූවකි.


පෙරහරට පෙර ආගමික වතාවත් සිදුකරන අයුරු


මෙලෙස සංවර්ධන වැඩ කරමින් දිනෙන් දින කල් ගෙවෙද්දී තිළිණ මධුශංක මහතා බස්නායක නිලමේවරයා ලෙස පත්වීමේදී ඇතිකරගත් අරමුණ කරා ළඟාවූයේ පසුගිය ඇසළ පෙරහර මංගල්‍යයේදීය. ඒ කප් සිටුවීමේ චාරිත්‍රයට අදාළ නැකත කල් තියා ප්‍රසිද්ධ කර බැතිමතුන්ට ඊට සහභාගිවන්නට අවස්ථාව ලබාදීමය. ඊට ජනතා ප්‍රසාදය ද නොමඳව හිමි විය. කොරෝනා වසංගතය හේතුවෙන් දෙවසරක් වීථි සංචාරය නොකළ ඇසළ මහා පෙරහර පසුගිය වසරේ සිට දෙස් විදෙස් ජනතාවගේ නෙත් සිත් පිනවමින් සාර්ථකව පවත්වන ලදි.


අයිරාංගනී ලියනගේ මහත්මිය

තිළිණ මධුසංඛ මහතා බස්නායක නිලමේ ධුරයට පත්වීමෙන් පසු දෙව්නුවර පරමවිචිත්‍රාරාම රාජමහා විහාරස්ථානය හා ශ්‍රී විෂ්ණු මහා දේවාලය මූලික කරගෙන ආරම්භ කළ සේවාවන් අතර කිරිපිඬු බුද්ධ පූජාව, දෙතිස් මහා ව්‍යාංජන පූජාව, සවස පහට බෝධීන්වහන්සේ අබියස පවත්වන අෂ්ට පාන පූජාව, සෑම පුර පසළොස්වක පොහොය දිනකම පවත්වන ධර්ම දේශනාව, ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් පවත්වන උපකාරක සම්මන්ත්‍රණ මාලාව, එම දරුවන් වෙනුවෙන් පවත්වන ගණදෙවි පූජාව, මනෝවිද්‍යාත්මක උපදේශන වැඩසටහන්, පෙරපාසල් ගුරුවරුන් පුහුණු කිරීම, සේවක සුබසාධන සේවා ආරම්භ කිරීම, පෙරපාසල් දරුවන් සඳහා දිවා ආහාරය ලබාදීම හා ශ්‍රී විෂ්ණු මහා දේවාල පරිශ්‍රයේ ග්‍රැනයිට් අතුරා අලංකාර කිරීම ද ප්‍රමුඛස්ථානයේහි ලා සැලකිය හැකිය. ඊට අමතරව ඒ මහතා විසින් දේවාල භූමියේ පහන් කණු 40ක් ද ස්ථාපිත කරවා තිබේ.

මේ සියලු කටයුතුවලදී දෙව්නුවර පරම විචිත්‍රාරාම රාජ මහා විහාරාධිපති අමරපුර ශ්‍රී කල්‍යාණවංශ මහා නිකායේ මහා නායක ආචාර්ය දෙව්නුවර සිරි සුනන්ද නාහිමියන්ගෙන් ලැබුණු අනුශාසනා, හිටපු ගුරු මධ්‍යස්ථාන කළමනාකාරිනි ශ්‍රීමතී අයිරාංගනී ලියනගේ, බස්නායක නිලමේවරයාගේ ලේකම් රෝහණ ජයසිංහ, ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ ප්‍රධාන කපුමහතා වන තිස්ස මහානාම යන මහත්ම මහත්මීන්ගෙන්, නිලමේවරයාගේ පවුලේ උදවියගෙන් මෙන්ම බස්නායක නිලමේ කාර්යාලයේ කාර්ය මණ්ඩලයෙන් ද නොමඳ සහායක් හිමිවූ බව බස්නායක නිලමේවරයා සඳහන් කළේය.

■ ජයසිරි පේදුරුආරච්චි - මාතර


තිළිණ මධුසංඛ මහතා පෙර පාසල් දරුවන් සමග


තිස්ස මහානාම මහතා


රෝහණ ජයසිංහ මහතා



මෙවර පෙරහර පවත්වන දින හා නැකත්


පූජා භූමියේ පිහිටි ඓතිහාසික ගල් උළුවස්ස


දෙව්නුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය

01 වැනි පිටුවෙන්...

## පච්ච නියාමනය....

මෙරට පන්දහසකට ආසන්න ටැටූ ආයතන ප්‍රමාණයක් ඇති අතර ශ්‍රී ලංකා ටැටූ සංගමය පවසන්නේ ඉන් 140ක් පමණක් සංගමය යටතේ ලියාපදිංචි වී ඇති බවයි.

පච්ච කොටන සියලුම ආයතනවලට ශල්‍යාගාරයක ඇති පහසුකම් සැපයිය යුතු අතර පච්ච කෙටීමට යොදගන්නා වැඩබිම විෂබීජහරණය හා උපකරණ ජීවානුහරණය කර තිබිය යුතු බවද එම සංගමය පෙන්වා දෙයි. එමෙන්ම ඔවුන් පවසන්නේ පච්ච කෙටීමට යොදගන්නා කටු වර්ග එක්වරක් පමණක් භාවිත කළ යුතු අතර ඇතැම් ආයතන ඒවා විෂබීජහරණය කිරීමකින් තොරව කිහිපවාරයක්ම භාවිත කරන බවත්ය. මේ හේතුවෙන් සමාජ රෝග ඇතුළු විවිධ රෝග බෝවීමේ අවදනමක් ඇති බවද ඔවුන් පෙන්වා දෙයි.

මෙලෙස භාවිත කරන කටු වර්ග විනාශ කරදැමීමට කිසිදු ක්‍රමවේදයක් නොමැති බවද ඒවා නිසි පරිදි බැහැර නොකිරීමෙන් පවා ජනතාවට හානිකර විය හැකි බව සංගමය පෙන්වා දෙයි.

පච්ච කෙටීමේ ආයතනයක් පවත්වාගෙන යාම වෙනුවෙන් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතියක් ලබාගැනීමට පවා මෙරට පහසුකමක් නොමැති බව එම සංගමයේ නිර්මාතෘ සජිත් ද සිල්වා පෙන්වා දෙයි.

"අපිට බීආර් එකක්වත් ගන්න ක්‍රමයක් නැහැ. මේ නිසා ටැටූ කරන ළමයෙක්ට ආයතනය දියුණු කරන්නැයි කියා නීත්‍යානුකූලව ණයක්වත් ගන්න බැහැ. හැබැයි බදුත් ගෙවනවා. ටැටූ ගැන ඉගෙනගන්න ලංකාවේ රජයේ කිසිදු ආයතනයක පාඨමාලාවක් නැහැ. කිසිදු දැනුමක් නැති අය දැන් ටැටූ ගහනවා. ලංකාවේ එහෙම වුණත් පිටරටවල වෙනම පුහුණු පාඨමාලාවක් හදරන්න ඕනෑ. අපි වෘත්තීය පුහුණු පාඨමාලාවකට අවශ්‍ය විෂය නිර්දේශයක් හදලා දුන්නා. ඒත් ඒ ගැනවත් රජයේ අවධානයක් නැහැ. හොර පාරේ ගේන උපකරණ නිසා ලෙඩරෝග බෝවෙනවා.

මේ නිසා සමාජ රෝග ආදිය බෝවීමේ වැඩි අවදනමක් තියෙනවා. වසර පහකට සැරයක් හෙපටයිටිස් සඳහා එන්නත් විදගැනීම අත්‍යවශ්‍යයි. ඒත් ගොඩක් අය එහෙම විදගන්නෙ නැහැ. ලෙඩ රෝග හැදුන ගොඩක් අය අපිව හොයාගෙන එනවා. තුවාලවෙලා. බිබිලි දලා. විවිධාකාරයේ රෝග හැදිලා. සමහරුන්ට හැදිලා තියෙන්නෙ මොන වර්ගයේ ලෙඩක්ද කියලා අපි දන්නෙත් නැහැ. හරියට ටැටූ එකක් ගැහුවා නම් මේ කිසිදු ප්‍රශ්නයක් එන්න විදියක් නැහැ. බොඩි මොඩිෆිකේෂන් කරන්න කලින් සෞඛ්‍ය තත්ත්වය පවා පරීක්ෂා කරන්න ඕනෑ. අඩුම තරමේ අපේ රටේ සෞඛ්‍ය බලධාරීන්ටවත් මේ ගැන හරිහමන් අවබෝධයක් නැහැ."

අප මේ සම්බන්ධයෙන් ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන වැඩසටහනේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය ජානකී විදනපතිරණගෙන් කළ විමසීමේදී ඇය කියා සිටියේ දැනට හඳුනාගත් රෝගීන්ට රෝගය වැලඳුනේ කෙසේදැයි නිශ්චිතවම හඳුනාගෙන නොමැති බවයි. එහෙත් පච්ච කෙටීමේදී හෙපටයිටිස් රෝගය වැලඳීමේ අවදනමක් ඇතැයිද ඇය පැවසුවාය.

## LTTE ප්‍රබලයන් දෙදෙනකුට ...

පුද්ගලයන් 91 කට ජීවිත අහිමි වූ මහ බැංකු බෝම්බ ප්‍රහාරය සම්බන්ධ වැරදිකරු වී සිටි සෙල්ලයියා නවරත්නම් (69) හා එල්ටීටීඊ භාණ්ඩ ප්‍රවාහනය කළ චෝදනාව ලැබූ එස්. සන්මුගරාජ් (56) මෙසේ නිදහස්ව ගොස් ඇත. ඒ ඉකුත් 18 දය.

මහාධිකරණයෙන් වසර දෙසීයක සිර දඬුවම් නියම වූ සෙල්ලයියා නවරත්නම්ගේ දඬුවම අභියාචනාධිකරණයේදී තහවුරු කර තිබේ.

මෙම දෙදෙනාට යහපත් කල්ක්‍රියාව යන පදනම යටතේ ජනාධිපති සමාව ලැබී ඇතැයි අධිකරණ අමාත්‍යංශයේ ප්‍රකාශකයකු පැවැසීය.

## අතුරුදන් වූ මව....

මෙලෙස අතුරුදන් වී ඇත්තේ හේවාහැට රහතුන්ගොඩ රිවඩේල් ප්‍රදේශයේ වයස අවුරුදු විසි දෙකක් වන වෙල්ලේඅම්මා සුරේන්ද්‍රනි රාණි හා වයස අවුරුදු එකයි මාස හතක් වන තරුෂිකා අබි නමැති ඇයගේ දියණියයි.

මෙම කාන්තාවගේ සැමියා විසින් හඟුරන්කෙත පොලිසියට පැමිණිල්ලක් සිදුකර ඇත්තේ බෙහෙත් ගැනීමට පසුගිය 17 වැනිද නිවසෙන් පිට වූ ඇය ගැන කිසිදු තොරතුරක් නැති බව කියමිනි.

මේ අනුව සිදුකළ විමර්ශනවලදී මෙකී කාන්තාව තම දරුවා සමගින් 17 වැනිද බස් රථයෙන් රිකිල්ලගස්කඩ නගරයට පැමිණෙන ආකාරයත් ස්ථාන කිහිපයක රැඳී සිටින ආකාරයත් නිරීක්ෂණය වී තිබෙන බව හඟුරන්කෙත පොලිසිය සඳහන් කරයි.

මැය කලක පටන් ආර්ථික තත්ත්වය නිසා සැමියා සමගින් ආරවුල් ඇතිකරගෙන ඇතැයිද ඇය ඒ හේතුවෙන් මෙලෙස නිවසෙන් යන්නට ඇතැයිද සැකකරන පොලසිය ඇයගේ සහ දරුවාගේ ඡායාරූප සියලු පොලිස් ස්ථාන වෙත යවා ඇතැයිද සඳහන් කරයි.

# මාදිවෙල මන්ත්‍රී නිවාස 42ක ඉන්නේ පිටස්තරයෝ

■ නිලන්ත මදුරාවල

පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වෙනුවෙන් මාදිවෙල පිහිටුවා ඇති නිවාස සංකීර්ණයේ නිවාස හතළිස් දෙකක පදිංචිව සිටින්නේ පිටස්තර පුද්ගලයන් බව අනාවරණය වී තිබේ.

මෙම තත්ත්වය මන්ත්‍රිවරුන්ගේ ආරක්ෂාවට තර්ජනයක් හෙයින් එම නිවාසවල පදිංචිකරුවන් සම්බන්ධ වාර්තාවක් කතානායක මහින්ද යාපා අබේවර්ධන විසින් කැඳවනු ලැබ ඇතැයි පාර්ලිමේන්තු ආරංචි මාර්ග කීවේය. කථානායකවරයා මෙම වාර්තාව කැඳවා ඇත්තේ පිටස්තර පුද්ගලයන් පදිංචිව සිටින බවට වන වාර්තාවක් තමන් අතට පත්වීමෙන් පසුව යැයි ද එම ආරංචි මාර්ග සඳහන් කළේය.

එම පිටස්තර පුද්ගලයන් සම්බන්ධයෙන් අදළ නිවාස කුලියට ලබා ගෙන ඇති මන්ත්‍රිවරුන් ලිඛිතව දැනුවත් කිරීමටද නියමිතය.

මෙම නිවාස සංකීර්ණයේ නිවසකට පසුගිය 19 වැනිද පිටස්තර පුද්ගලයෙක් ඇතුළු වූ බව කියන සිද්ධියක් සම්බන්ධයෙන් ආරක්ෂක අංශ ද දැඩි කැළඹීකට පත් වී තිබිණි. එම පුද්ගලයා පැමිණ ඇත්තේ යුද හමුද සාමාජිකයන් පිරිසක් සිටින නිවාසයකට බව පැවසෙන අතර ඊට යාබද නිවසේ පදිංචි මන්ත්‍රිවරයා කළ ඉල්ලීමකට අනුව මේ වන විට එම නිවාසයෙන් හමුද සාමාජිකයන් ඉවත් කර ඇති බව පැවසේ.

මෙහි නිවාස එකසිය විස්සක් පවතින අතර ඉන් එකසිය එකොළහක් මන්ත්‍රිවරුන් වෙනුවෙන් සහ ඉතිරි නවය ආරක්ෂක අංශ සාමාජිකයන්ට මෙන්ම නිවාස සංකීර්ණයේ සේවා කටයුතු කරන පිරිස් වෙනුවෙන් වෙන් කර තිබේ. රුපියල් දහසක මාසික කුලියක් මත මන්ත්‍රිවරුන්ට මෙම නිවාස වෙන්කර ගැනීමට පහසුකම් සලසා ඇත.

01 වැනි පිටුවෙන්...

## උපන් දින සාදයේ...

ඊයේ (23 වැනිද) අලුයම අදළ නිවසට කඩාවැදුණු කණ්ඩායමක් නිවසේ සිටි පිරිස තියුණු ආයුධවලින් කපා දමා අනතුරුව, නිවැසියන් නිවස තුළට ගිය අවස්ථාවක නිවසට ගිනි තබා ඇති බව පොලිසිය පැවසුවේය.



හානි වූ CCTV

සිද්ධියෙන් 22 හැවිරිදි කාන්තාවක් ජීවිතක්ෂයට පත්ව ඇති අතර, මියගිය කාන්තාවගේ දරුවා වන වයස අවුරුදු 02ක කුඩා පිරිමි දරුවෙකු, අවුරුදු 07ක හා අවුරුදු 13ක ගැහැනු දරුවන් දෙදෙනෙකු, වයස අවුරුදු 19ත් 41ත් අතර පසුවන කාන්තාවන් 04 දෙනෙකු, වයස අවුරුදු 42ක පිරිමි පුද්ගලයකු තුවාල ලබා රෝහල් ගත කොට ඇති බවද පොලිසිය පැවසීය.

සිද්ධියෙන් ඕමන්ත ප්‍රදේශයේ පදිංචි 36 හැවිරිදි පුද්ගලයෙකුද තුවාල ලබා වවුනියාව මහ රෝහලේ ප්‍රතිකාර ලබන බව පොලිසිය සඳහන් කළේය.

වවුනියාව පොලිස් ස්ථානයට ලද 119 පණිවුඩයක් හරහා පොලිසිය අදළ ස්ථානයට ගොස් පරීක්ෂා කොට තිබිණ.

වවුනියාව නගර සභාවේ ගිනි නිවන ඒකකය, වවුනියාව පොලිසිය හා ප්‍රදේශවාසීන් සමග එක්ව ගින්න මැඩපත්වා තිබිණ.

ගිනි තබා ඇති නිවසේ පදිංචි පුද්ගලයා මුදල් පොලියට දීම හා තවත් ව්‍යාපාර සිදුකොට ඇති බව ප්‍රදේශවාසීහු පවසති.

මියගිය කාන්තාවගේ දරුවාගේ උපන්දින සාදය පැවැත්වෙමින් තිබූ අවස්ථාවක මෙය සිදුව ඇති බව ප්‍රදේශවාසීහු සඳහන් කරති.

මුහුණු ආවරණය කරගත් පිරිසක් පැමිණ නිවසට ගිනිතබා ඇති බවට CCTV දර්ශන මගින් අනාවරණය කරගෙන ඇති අතර, සිද්ධිය සම්බන්ධයෙන් වවුනියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

## අධිකාරියේ නිලධාරීන්...

මෙම තීරණය ගැනීමට ප්‍රධානතම හේතුව ලෙස ඇමැතිවරයා පෙන්වා දෙන්නේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ඇතැම් නිලධාරින් වැටලීම් සිදු කරන මුවාවෙන් වෙළෙඳසල් හිමියන්ගෙන් අල්ලස් ලබා ගැනීම බවය.

පසුගිය මාස කිහිපය පුරාම පිටකොටුව ප්‍රදේශයේ මෙරට තහනම් කරන ලද ආලේපන සහ සුවඳ විලවුන් අලෙවි කරන ලද වෙළෙඳසල්වල සිදුකළ වැටලීම්වලදී වැටලීම් නිලධාරීන් විසින් වෙළෙඳසල් හිමියන්ගෙන් අල්ලස් ලබාගෙන ඇති බවට තමාට වාර්තා වූ බවද ඇමැතිවරයා සඳහන් කළේය.

එම නිසා මින් ඉදිරියට සිදු කරන වැටලීම් සීමා කර වෙළෙඳසල් හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන බවත් ඊට අදළ සාකච්ඡා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරීන් සමග සිදු කරන බවත් හෙතෙම කීවේය.

මෙරටට භාණ්ඩ පැමිණෙන ප්‍රධානතම ස්ථානය රේගුව වන අතර ඉන් වෙළෙඳපොළට භාණ්ඩ යාමට පෙර නිසි අධීක්ෂණයක් සිදු විය යුතු බවත් එසේ නොමැතිව නිකරුණේ වෙළෙඳසල් වැටලීම් සිදු කර පලක් නොමැති බවත් ඇමැතිවරයා කියයි.

එහෙත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වැටලීම් සහ විශේෂ විමර්ශන සඳහා විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයකු වන රසල් ද සොයිසා වෙළෙඳ ඇමැති නලින් ප්‍රනාන්දු විසින් පත් කර ඇත.

එම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීන්දුවකට අනුව මෙම පත් කිරීම සිදු කර ඇති අතර ඔහුගේ අධීක්ෂණය යටතේ මින් ඉදිරියට වැටලීම් සිදු කරනු ලබයි.

## ප්‍රකෝටිපතියන්ගේ...

ඒ දැනට සංවිධානාත්මකව ඉඩම් අල්ලන කල්ලි විසින් කෝටිපතියන් දෙදෙනෙකු ඝාතනය කර අත්පත් කර ගෙන ඇති ඉඩම් සම්බන්ධව කරන විමර්ශනයකට අදළවය.

ලෝක බැංකුවේ ශ්‍රී ලංකා ශාඛාවේ ව්‍යාපෘති කළමනාකරු හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යාන්ත්‍රික ඉන්ජිනේරුවකු වූ සමන් විජේසිරි මහතාගේ දේපළ අයිති කර ගැනීමේ අදහසින් ඔහු ඝාතනය කර එය අබිරහසක් බවට පත් කළ කල්ලිය විසින් නොතාරිස්වරුගේ සහායෙන් අල්ලාගෙන ඇති බවව කියන ඉඩම් සම්බන්ධව කරන විමර්ශනවලදීත් මේ බව හෙළිවී ඇත.

මීට අමතරව ප්‍රකෝටිපතියකු වූ අශෝකා දසනායක මහතාගේ කොළඹ හතේ හා කොල්ලුපිටියේ ඇති නිවාසවලට හොර ඔප්පු සකස් කර ඒවා අත්පත් කර ගැනීමට ඔහු ඝාතනය කළ කල්ලියට උදව් දුන් නොතාරිස්වරු සම්බන්ධවද විමර්ශනයක් අරඹා ඇත.

නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය මෙම සතියේත් සමන් විජේසිරි මහතාට අයත් ඉඩමකට ව්‍යාජ ඔප්පු සැකසීම සම්බන්ධව හලාවත මහෙස්ත්‍රාත්වරයාට ද කරුණු වාර්තා කර තිබුණි.

එහිදී පර්චස් 105ක ඉඩමකට ව්‍යාජ ඔප්පු සකස් කළ බවට හෙළි වී ඇත. ඒවා වැඩිදුර විමර්ශන සඳහා රජයේ රස පරීක්ෂකවරයා වෙත යොමු කර ඇත.

අශෝකා දසනායක නමැති ප්‍රකෝටිපතියාගේ ඝාතනයෙන් පසුව ඉඩම්වලට හොර ඔප්පු සැකසූ නොතාරිස්වරුන් පසුපසද විමර්ශන කණ්ඩායම් විමර්ශන අරඹා ඇත.

01 වැනි පිටුවෙන්...

## ගතවූ වසර 7 තුළ....

ගතවූ වසර හත තුළ ප්‍රමිතියෙන් තොර ඖෂධ වර්ග 587 ක් භාවිතයෙන් ඉවත් කර ඇති බව සෞඛ්‍ය අමාත්‍යංශය පවසයි.

2017 වසරේදී ඖෂධ වර්ග 93 ක්, 2018 වසරේදී ඖෂධ වර්ග 85 ක්, 2019 වසරේදී ඖෂධ වර්ග 96 ක්, 2020 වසරේදී ඖෂධ වර්ග 77 ක්, 2021 වසරේදී ඖෂධ වර්ග 85 ක්, 2022 වසරේදී ඖෂධ වර්ග 86 ක් හා 2023 වසරේදී මේ දක්වා ඖෂධ වර්ග 65 ක් භාවිතයෙන් ඉවත් කර තිබේ.

''ප්‍රමිතියෙන් තොර ඖෂධ ලැබීම මේ වසරේ පමණක් සිදුවූ දෙයක් නෙවෙයි. මීට පෙර වසරවලද සිදු වෙලා තියෙනවා. නියමිත ක්‍රමවේද අනුගමනය කරන්නේ රෝගී ආරක්ෂාව වෙනුවෙන්. දේශීය වශයෙන් නිපදවන ඖෂධ මෙන්ම ලියාපදිංචි කළ ආනයනික ඖෂධද ප්‍රමිතියෙන් තොර බව පරීක්ෂණවලදී අනාවරණය වුවහොත් ඉවත් කරනවා'' සෞඛ්‍ය අමාත්‍යංශයේ අතිරේක ලේකම් විශේෂඥ වෛද්‍ය සමන් රත්නායක පැවැසුවේය.

ඉන්දීය ණය ආධාර යටතේ ආනයනය කළ ඖෂධ වර්ග 278 න් එක් ඖෂධයක් පමණක් ප්‍රමිතියෙන් තොර බව හෙළිවී තිබේ. හදිසි මිලදී ගැනීම් යටතේ ලබාගත් ඖෂධ වර්ග 308 න් එක් ඖෂධයක් පමණක් ප්‍රමිතියෙන් තොර බව හෙළිවී තිබේ. එවැනි ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීමට හැකිවන්නේ පරීක්ෂාවට ලක්කරන නිසා බවද අතිරේක ලේකම්වරයා කීවේය.

කිසියම් ඖෂධයක් නිෂ්පාදනය කිරීම සඳහා අමුද්‍රව්‍ය සකස් කිරීමේදී, නිෂ්පාදනයේදී, ඇසුරුම් කිරීමේදී, ලේබල් කිරීමේදී, නැව් ගත කිරීමේදී, ගබඩා කිරීමේදී, රෝහල්වලට ප්‍රවාහනය කිරීමේදී ,නිවැරදි උෂ්ණත්වය නොමැති අවස්ථාවකදී, ඖෂධ ප්‍රමිතියෙන් තොර විය හැකි බවත් ඔහු කියා සිටියේය.

ඖෂධ සම්බන්ධයෙන් සෞඛ්‍යයට සම්බන්ධ විවිධ සංගම් කරන ප්‍රකාශ මගින් ජාතික සෞඛ්‍ය පද්ධතිය පිළිබඳව රෝගීන්ට අවිශ්වාසයක් ගොඩ නැගී ඇති බැවින් එවැනි අපරාධ සිදු නොකරන ලෙස අතිරේක ලේකම්වරයා වෘත්තීය සමිතිවලින් ඉල්ලා සිටියේය.

## මෙරට ව්‍යාපාරිකයන්ට....

දුම්රිය ව්‍යාපෘතියක් සඳහා ආයෝජනය කිරීමට යැයි කියමින් බම්බලපිටියේ සහ අතුරුගිරියේ ව්‍යාපාරිකයන් දෙදෙනෙකුගෙන් රුපියල් ලක්ෂ හැත්තෑ හතරක් වංචා කළ මැලේසියානු කෘෂි ආචාර්යවරයකු කොළඹ වංචා විමර්ශන කාර්යංශය මගින් පෙරේද (22 වැනිද) අත්අඩංගුවට ගෙන තිබේ.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ මයිකල් නමැති 68 හැවිරිදි මැලේසියානු ජාතිකයෙකි.

කොළඹ වංචා විමර්ශන කාර්යංශය වෙත ලද පැමිණිල්ලකට අනුව වැඩිදුර විමර්ශන සිදුකළ එම කාර්යංශයේ විමර්ශන ඒකක අංක 06 හි ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රශින්ත පියරත්න ඇතුළු නිලධාරීන් මෙම සැකකරු අත්අඩංගුවට ගෙන තිබුණේ වෙනත් විදෙස් ගමන් බලපත්‍රයකින් මෙරටට පැමිණ සිටියෙදීය.

සැකකරු මීට පෙරාතුවද මෙම කාර්යාංශය විසින් අත්අඩංගුවට ගෙන තිබුණේ කොළඹ ප්‍රදේශයේම පුද්ගලයෙකුගෙන් රුපියල් ලක්ෂ පනස් දෙකක මුදලක් වංචා කිරීමේ සිද්ධියකටය. එම නඩුවට අදළව පොලිසිය මොහුට විරුද්ධව විදෙස් ගමන් තහනමක් ද ලබාගෙන ඇතත් ඔහු නඩුවෙන් ඇප ලබා මැලේසියාව වෙත පලාගොස් තිබුණි.

එලෙස රටින් පැනගිය මෙම සැකකරු ඔහුගේ නමින් වෙනත් විදෙස් ගමන් බලපත්‍රයක්ද සකස් කරගෙන ඇති අතර එහි තොරතුරු අනාවරණය කරගත් කොළඹ වංචා විමර්ශන කාර්යංශයේ විමර්ශන ඒකක 06 හි ස්ථානාධිපතිවරයා එම විදෙස් ගමන් බලපත්‍ර අංකයද හඳුනාගෙන ගුවන් ගමන් තහනමක් ලබාගෙන තිබිණි. මේ අනුව මෙරටට පැමිණ සිටියදී සැකකරු අත්අඩංගුවට ගෙන තිබෙන අතර සැකකරු කොළඹ තරු පන්තියේ හෝටල් කාමර වෙන්කරගනිමින් මෙරට තුළ රැඳී සිට ඇති අයෙකු බවත් ප්‍රකෝටිපතීන් පිරිසක් හා එක්ව මෙම මුදල් වංචාව සිදුකර තිබෙන බවත් කොළඹ වංචා විමර්ශන කාර්යංශය සඳහන් කරයි.

සැකකරු මැලේසියානු, ඉංගීසි භාෂා මෙන්ම සිංහල හා දෙමළ භාෂා ගැනද දැනුවත් අයෙකු බව පොලිසිය සඳහන් කරයි.

කොළඹ වංචා විමර්ශන කාර්යංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දුමින්ද බාලසූරියගේ උපදෙස් මත විමර්ශන ඒකක අංක 06 හි ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රශිත්ත පියරත්න, පොලිස් සැරයන් 42110 ධර්මදස, පොලිස් කොස්තාපල් 100562 කරුණාදස යන නිලධාරීන් සැකකරු කොටුව මහෙස්ත්‍රාත් හමුවට ඉදිරිපත් කළ අතර එහිදී ඔහුට රුපියල් ලක්ෂ පනහ බැගින් වූ ශරීර ඇප දෙකක් මත මුදහැරීමට නියෝග කෙරිණි. එහෙත් ඇප කොන්දේසි සපුරාලීමට අපොහොසත් වීම මත සැකකරු හෙට (25 වැනිද) තෙක් රක්ෂිත බන්ධනාගාර ගතකෙරිණි.


සෙනසුරාදා ශීඝ්‍ර දිනුම් 2023.07.22 www.nlb.lk
මහජන සම්පත දිනුම් වාරය : 5183 රු. 25,025,424.00
P 6 2 2 7 1 4
3425 රු.70,016,857.60
1 22 23 27 56
6 2 9 5 6 6
0009 1 1 රු.10,000,000.00
ධන නිධානය 1213 රු. 101,192,624.80
I 23 34 35 39 I
492 රු.3,668,607.40
07 18 21 61
Mega Power 1531 Rs.402,006,052.00
H 12 35 36 47 80
රු. 10,000,000.00
රු. 10,000,000.00

සිකුරාදා ශීඝ්‍ර දිනුම් 2023.07.21 www.nlb.lk
මහජන සම්පත දිනුම් වාරය : 5182 රු. 24,530,472.00
Z 3 7 1 7 5 0
3424 රු.69,801,520.00
G 15 26 63 65
0 3 9 8 5 9
0008 2 3 රු.10,000,000.00
ධන නිධානය 1212 රු. 101,009,850.40
A 06 14 24 75 A
491 රු.3,643,485.40
07 23 34 38
Mega Power 1530 Rs.401,868,232.00
K 15 49 72 73 75
රු. 10,000,000.00
රු. 10,000,000.00


# පස් වසරක් එක තැන සිටි ප්‍රාදේශීය ලේකම්වරුන්ට මාරුවීම්

## සමහරු දේශපාලන රැකවරණය මැද ඉඳලා

■ හර්ෂණී දිසානායක

වසර පහකට වැඩි කාලයක් එකම ස්ථානයේ සේවය කර ඇති ප්‍රාදේශීය ලේකම්වරුන්ට වහාම ස්ථාන මාරුවීම් ලබා දිය යුතු බවට රජය තීරණය කර ඇත. මීට හේතු වී ඇත්තේ ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරු දේශපාලන රැකවරණ ලබමින් එකම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වසර ගණනාවක් සේවය කිරීමය.

ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් මෙම තීරණය ගෙන ඇත්තේ අගමැති දිනේෂ් ගුණවර්ධනගේ මූලිකත්වයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගේ සහභාගිත්වයෙන් පැවැති රැස්වීමකදීය.

එකම ස්ථානයේ වසර පහකට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරීන් අවම වශයෙන් දිස්ත්‍රික්කය තුළ ඇති වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ මාරු කර යැවීමට කටයුතු කරන ලෙස අගමැතිවරයා විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් දී ඇත. ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරු නොයෙක් ආකාරයේ විෂමාචාර ක්‍රියාවන්හි නිරතවන බවත් මේ හේතුවෙන් ස්ථානමාරුවීම් විධිමත්ව සිදු නොවන බවට දිස්ත්‍රික් කමිටු සභාපතිවරුන් මෙහිදී අගමැතිවරයාට කරුණු දන්වා තිබිණි.

එමෙන්ම ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරු සිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සමග සුහදව කටයුතු නොකරන බවටද චෝදනා එල්ල වී තිබේ. තවද ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරු උදසීනව කටයුතු කිරීම නිසා නිසි ජනතා සේවාවක් ඉටු නොවන බවද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු මෙහිදී පෙන්වා දී තිබේ.

කතුවැකිය
ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk
කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk
Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

# සෙල්ලම ලෙල්ලම කරන වීඩියෝ ක්‍රීඩා

වීඩියෝ ක්‍රීඩාවලට ඇබ්බැහි වූ උතුරේ සරසවි සිසුවෙක් එවැනි එක් වීඩියෝ ක්‍රීඩාවක විධානයන් හමුවේ අසරණ වී සියදිවි හානිකරගත් පුවතක් ඉකුත් සතියේ මාධ්‍ය මගින් වාර්තා කර තිබිණි. එකී පුවත අනුව මෙම සිසුවා දවසේ බොහෝ වෙලාවක් වීඩියෝ ක්‍රීඩාවල නිරත වී තිබේ. එසේම ඉතාම අනතුරුදායක සේ සලකන වීඩියෝ ක්‍රීඩාවල මොහු නිරත වී ඇත. සැබැවින්ම වීඩියෝ ක්‍රීඩා නිසා මෙවැනි සිදුවීම් වාර්තා වූ පළමු අවස්ථාව මෙය නොවේ. එහෙත් මෙම සිදුවීම කෙරෙහි සමාජයක් හැටියට අපගේ අවධානය යොමු විය යුතුය. මෙරට දරු පරපුර බිලිගනිමින් සිටින මෙම අනතුර නිසිලෙස තක්සේරුකර ඊට පිළියම් යෙදීමට අප සමාජයක් හැටියට අවධානය යොමු කර තිබේද? වීඩියෝ ක්‍රීඩාවලට ඇබ්බැහි වූ දරුවන් අපරාධවලට පෙලඹීමේ ප්‍රවණතාවයේ වර්ධනයක් ලෝක මට්ටමින්ද දැකිය හැකිය. අපගේ කලාපයේ ඉන්දියාව, පකිස්ථානය වැනි රටවලින් එවැනි සාපරාධී සිදුවීම් රැසක් පිළිබඳ තොරතුරු සොයාගත හැකිය. මෙයට සුළු කලකට පෙර ඉන්දියාවේ දහසය හැවිරිදි දරුවෙක් පියාගේ පිස්තෝලය සොරකම් කර මවට වෙඩි තබා මරා දැම්මේය. එයට හේතුව මෙකී සිසුවා නිරන්තරයෙන් වීඩියෝ ක්‍රීඩාවලට ඇබ්බැහිවීමට එරෙහිව මව චෝදනා කිරීමය. එසේම මෙයට වර්ෂයකට පමණ පෙර පකිස්ථානයේ ලාහෝරයේ දහහතර හැවිරිදි සිසුවෙක් තම මව, සහෝදරයන් දෙදෙනා, සහෝදරියක මරා දැම්මේය. ඔහුද වීඩියෝ ක්‍රීඩාවලට දැඩිව ඇබ්බැහි වූ තැනැත්තෙක් විය. ලෝක සෞඛ්‍ය සංවිධානය සඳහන් කරන පරිදි මේ ආකාරයට වීඩියෝ ක්‍රීඩාවලට ඇබ්බැහිවීම මානසික රෝගී තත්ත්වයකි. ලෝක ජනගහනයෙන් සැලකිය යුතු පිරිසක් ඊට ඇබ්බැහිවී සිටින බව එම සංවිධාන දත්ත පෙන්වා දෙයි.

අන්තර්ජාලයේ සැරිසරන අයට වීඩියෝ ක්‍රීඩා ඕනෑතරම් සොයාගත හැකිය. 1950-60 අතර කාලයේදී වීඩියෝ ක්‍රීඩාවල ආරම්භය සිදුවී තිබේ. එම වකවානුවල වීඩියෝ ක්‍රීඩාව සැලකුවේ දරුවන්ගේ බුද්ධි වර්ධනයට, තාර්කික චින්තනයට, ගණිතමය හැකියාවන්ට පිටිවහලක් සේ මෙකී ක්‍රීඩා භාවිත කළ හැකි බවය. සැබැවින්ම එවැනි පැත්තක්ද මෙම ක්‍රීඩාවල තිබේ. එහෙත් එයට වඩා මෙම ක්‍රීඩාවල අනතුරුදායක බව වැඩිවී තිබේ. බොහෝ විට අපේ රටේ මව්පියන් සුලභව කරන චෝදනාවක් බවට පත්වී තිබෙන්නේ සුහුරු ජංගම දුරකථනයක් තිබෙන දරුවන් කොහෝ හෝ මුල්ලකට වී නොකා නොබී මුහුණ කටද නොසෝද, ආහාරපාන ගැනද උනන්දුවක් නොදක්වා එක දිගට වීඩියෝ ක්‍රීඩාවල නිරතවන බවය. මේ දරුවන් තුළ නොරිස්සුම් සහගත සිතිවිලිවල වර්ධනයක් දැකිය හැකි බවද මව්පියෝ පෙන්වා දෙති. මෙසේ සාමාන්‍ය වීඩියෝ ක්‍රීඩාවලට ඇබ්බැහි වූ දරුවෝ තිරයෙන් පිටුපස සිට විවිධ කණ්ඩායම් ඉතා පහත් අරමුණින් අන්තර්ජාලයට මුදාහැර තිබෙන වීඩියෝවලටද ඇබ්බැහි වෙති. මෙම වීඩියෝ ක්‍රීඩාවල ඉතා සැලසුම් සහගත අරමුණක් තිබේ. එවැනි වීඩියෝ ක්‍රීඩා අතර, බ්ලූවේල් නමැති වීඩියෝ ක්‍රීඩාව ඉතා මාරාන්තික ප්‍රතිඵල ගෙන දෙන්නකි. දින පනහක් තිස්සේ ක්‍රියාත්මක වන වැඩසටහනක් මෙම වීඩියෝ ක්‍රීඩාව තුළ තිබේ. උදේ හතරට පමණ අවදි වී මෙම ක්‍රීඩාවේ නිරත වීමට උපදෙස් ලැබේ. ඒ පිළිවෙළට වීඩියෝ ක්‍රීඩාව කරගෙන යන ළමයින් විවිධ මානසික විකෘතිතාවලටද අපරාධවලටද පෙලඹී සිටිති. අන්තර්ජාල තොරතුරු විශේෂඥයන් සඳහන් කරන ආකාරයට මෙකී වීඩියෝ ක්‍රීඩාව මුදාහළ අයගේ අරමුණ වනුයේ දුර්වල මානසිකත්වයක් තිබෙන අය සියදිවි හානිකරගැනීමට සලස්වා ලෝක ජනගහනය පාලනය කර ලෝකය සංවිධානය කිරීමය. ඔවුන් සඳහන් කරන්නේ දුර්වල මානසිකත්වයක් තිබෙන අය ලෝකයෙන් ඉවත් විය යුතු බවය.

මෙකී වීඩියෝ ක්‍රීඩාවලින් කරනුයේ දරුවන් ඇතුළු ඊට ඇබ්බැහි වූවන්ගේ ජීවිත ඔවුන්ටද නොදැනුවත්ව මෙහෙයවීමය. ක්‍රීඩාව සුළු කාලයක් කරගෙන යන විට ඔවුන්ගේ ග්‍රහණයෙන් ජීවිතය වෙනස් වෙයි. ඉන් පසු ඒ ජීවිත මෙහෙයවනුයේ බ්ලූවේල් වැනි මාරාන්තික පරිගණක ක්‍රීඩා මගිනි. මෙය පුද්ගලික වශයෙන්ද සමාජයීය වශයෙන්ද ඉතා අනතුරුදායක බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. ඇමෙරිකාවේ කළ පර්යේෂණයකින් හෙළි වී තිබෙන පරිදි බෙහෙවින් ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමුවනුයේ මෙවැනි වීඩියෝ ක්‍රීඩාවලට ඇබ්බැහි වූ පාසල් සිසු සිසුවියන්ය. විශේෂයෙන් යාන්ත්‍රික අධ්‍යාපන රටාවකට හුරුවී සිටින දූදරුවෝ මෙවැනි ක්‍රීඩාවලට පහසුවෙන් ගොදුරු වී සිටිති. එමගින් ඔවුන් වළක්වා ගැනීමට මව්පියන්ගේ සහ ගුරුවරුන්ගේ අවධානය යොමු විය යුතුය. දරුවන්ගේ ඒකාකාරී ජීවිතයෙන් ඔවුන් නිදහස් කරගැනීමට ගත හැකි පියවර ගත යුතුය. අද බොහෝ මවුපියන් දරුවන් පාලනය කරගැනීම සඳහා අනුගමනය කරන උපක්‍රමය වන්නේ ඔවුන්ට ජංගම දුරකථනයක් දී නිහඬ කිරීමය. වයස අවුරුදු දෙක තුනේ දරුවන්ට පවා මව්පියෝ ජංගම දුරකථන ලබාදෙති. එවැනි දරුවන් කුඩා වියේ සිට වීඩියෝ ක්‍රීඩාවලට ඇබ්බැහිවීම පුදුමයට කරුණක් නොවේ. අනෙක් අතට ජංගම දුරකථනය අද අධ්‍යාපන මෙවලමක් බවට පත්වී තිබේ. මවුපියන් කළ යුත්තේ පරිගණක ආදිය තමන්ට නිරීක්ෂණය කර හැකි තැනක තබා ඒවා මගින් අධ්‍යාපන කටයුතු කරගෙන යාමට දරුවන්ට ඉඩ සැලසීමය. එසේම පරිගණක විශේෂඥයන්ගේ උපදෙස් ලබාගෙන හානිකර හැකි වීඩියෝ දර්ශන ජංගම දුරකථන හෝ පරිගණක මගින් අවහිර කිරීමටද පියවර ගත හැකිය. මෙවැනි පියවර නොගතහොත් ඉතා භයානක තැනකට ඔබත් නොදැනුවත්ව ඔබේ දරුවා ගමන් කරනවා ඇත. එසේම දරුවන් කුඩා අවධියේ සිට පොතපත කියවීමට හුරුකරවීමද එහිලා ගත හැකි කදිම පියවරකි. පොතපත කියවීමේ සංස්කෘතිය බිඳවැටීම මෙකී මාරාන්තික වීඩියෝ ක්‍රීඩා භාවිතය බහුලවීමට ප්‍රධාන හේතුවකි. අධ්‍යාපන බලධාරීන් ප්‍රධාන ආණ්ඩුවද පාසල් සහ උසස් අධ්‍යාපන ක්‍රමවේද වෙනස් කර යාන්ත්‍රික බවින් මුදාගෙන දරුවන්ගේ විනෝදස්වාදය ඇතුළු සෞන්දර්ය කුසලතා වර්ධනය කරන වැඩපිළිවෙළකට නොපමාව යොමුවිය යුතුය. එසේ නොවුණහොත් උතුරෙන් පමණක් නොව රටේ දස දෙසින් වීඩියෝ ක්‍රීඩා විපත් වාර්තාවීම නොවැළැක්විය හැකි වනු ඇත.



# අපි පොහොට්ටුවත් එක්ක නෑ රනිල් එක්ක විතරයි

**පක්ෂයේ ප්‍රතිපත්තිවලට පිටුපාමින් ආණ්ඩුවේ තනතුරු ගත්තා යැයි කියමින් ශ්‍රීලනිපයේ තනතුරු දැරූ අමාත්‍ය නිමල් සිරිපාලද සිල්වා, මහින්ද අමරවීර ඇතුළු කිහිප දෙනෙක් ගේ අහෝසි කළ පක්ෂයේ තනතුරුවල, නැවත ඔවුන් පිහිටුවීම එම පක්ෂයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මෛත්‍රීපාල සිරිසේන ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදුවිය. ඒ අධිකරණය ලබාදුන් තීන්දුවක් අනුවය. ඒ අනුව ලසන්ත අලගියවන්නට පක්ෂයේ භාණ්ඩාගාරික ධුරය ද හිමි විය. එහෙත් ආණ්ඩුවේ තනතුරු අත්හැර නැත. ඔහු ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යවරයාය. ශ්‍රීලනිපයේ සභාපති ඇතුළු කණ්ඩායමක් සිටින්නේ ආණ්ඩුවේ තනතුරු බාරනොගන්නා ස්ථාවරයේය. එවැනි තත්ත්වයක් යටතේ නැවත ශ්‍රීලනිපයට ආ පිරිස පක්ෂයේ ප්‍රතිපත්ති අනුව කටයුතු කරන්නේ ද? මේ ඒ ගැන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න කියන දේය.**

**අධිකරණ තීන්දුවකට අනුව ඔබ ඇතුළු පිරිසක් නැවත ශ්‍රීලනිපය සමග එකතු වී සිටිනවා. ඔබ පක්ෂයේ භාණ්ඩාගාරික ලෙසත් වගකීම බාර අරගෙන තියෙනවා. ඇත්තටම ඔබලා හදවතින්ම ශ්‍රීලනිපයේ ඉන්නවා ද? නැත්නම් අධිකරණ තීන්දුව නිසා ඉන්නව ද?**

අපි අධිකරණයට ගියෙත් ශ්‍රීලනිපයේ ඉන්න ඕනේ නිසයි. ඒ නිසා අපි හදවතින් ම ඉන්නෙ ශ්‍රීලනිපයේ. අනෙක අපි නව දෙනාම පක්ෂ මාරු නොකරපු අඛණ්ඩව ශ්‍රීලනිපය එක්ක කටයුතු කළ අය. ශ්‍රීලනිපය අපි පක්ෂයෙන් ඉවත් කරන්න තීන්දු කළත් අපි වෙන පක්ෂයකට ගියේ නෑ. සමහර පක්ෂවලින් අපිට විශාල ලෙස ඉල්ලුමක් තිබුණා. දිස්ත්‍රික් නායකකම් පවා අපිට දෙන්න හැදුවා. මතක තියාගන්න අපි දේශපාලනය නොකර ගෙදර ගියත් ශ්‍රීලනිපය අතහැරලා යන්නෙ නෑ. අපි දැන් නැවතත් අපේ මහගෙදරට ඇවිල්ලා ඉන්නෙ. දැන් අපි ගම්මට්ටමේ ශ්‍රීලනිප පාක්ෂිකයන් ශක්තිමත් කරන වැඩපිළිවෙළක් දියත් කරන්න ඕනේ.

**ඔබ උදම් අනනවා ඔබ මහ ගෙදරට ආවා කියල. නමුත් ඔය මහ ගෙදර ප්‍රතිපත්ති එක්ක ඔබලාගේ ක්‍රියාකාරකම් ගැටෙනවා නේ ද?**

අපේ මොන ක්‍රියාකාරකම්ද ශ්‍රීලනිපයත් එක්ක ගැටෙන්නෙ?

**ශ්‍රීලනිපය ප්‍රතිපත්තියක් විදියට සර්වපාක්ෂික ආණ්ඩුවක දී හැර රජය සමග එකතු නොවන බවට ප්‍රතිඥා දී තිබිය දී ඔබලා ආණ්ඩුවේ තනතුරු අරගෙන ඉන්නවා නේද?**

එහෙම ප්‍රතිඥාවක් දීල කියල අපි දන්නෙ නම් නෑ. අපි ආණ්ඩුව එක්ක එකතු වුණේ තනතුරු ගන්නම නොවෙයි. රට වැටිල තිබුණ මොහොතේ රටට ආදරේ කරන පිරිසක් විදියට රට ගොඩගන්න ආණ්ඩුවට සහය දෙන්න ඕනේ කියල අපි තීරණය කරල තමයි ආණ්ඩුවට එකතු වුණේ. ඒක වරදක් කියල අපි හිතන්නෙ නෑ. අපි නියෝජනය කරන මේ ආණ්ඩුව පිහිටුවන වෙලාවේදි කැලෑ නීතිය තමයි රටේ ක්‍රියාත්මක වුණේ. ජනතාව ඉතාම දුක්ඛිත තත්ත්වයට පත්ව සිටියා. එවැනි අවස්ථාවක තමයි අපි ජනාධිපතිවරයාට සහය දීලා රට යථා තත්ත්වයට පත් කරන්න යම් වගකීමක් බාර ගත්තෙ. දැන් රටේ තත්ත්වය යහපත් අතට හැරෙමින් තියෙනවා. ශ්‍රීලනිපය නියෝජනය කරමින් අපි ඊට මැදිහත් වූ නිසා ශ්‍රීලනිපයටත් එහි ගෞරවය හිමිවෙනවා.

අනෙක ශ්‍රීලනිපය මැතිවරණයේ දී ලබා ගත් මන්ත්‍රී සංඛ්‍යාව දහහතරයි. එයින් නම දෙනෙක් ආණ්ඩුවට එකතු වුණාම බහුතර මතය එතැන නියෝජනය වෙනවා. අනෙක අපි සියලු දෙනාම මැතිවරණයේ දී ජයග්‍රහණය කරල පාර්ලිමේන්තු ආපු අයයි. ජනතාව අපිට ඡන්දය දුන්නෙ ඇයි කියලත් අපි කල්පනා කරන්න ඕනේ.

**ශ්‍රීලනිප මහ ලේකම් දයාසිරි ජයසේකර කියන්නෙ ඔබලා පක්ෂයට නැවැත ගත්තා නම් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියත් නැවත පක්ෂයට ගන්න ඕනේ කියල නේද?**

ඔව්, අපිත් කියන්නෙ ඇයත් ශ්‍රීලනිපයට එකතු කර ගන්න ඕනේ. ඒ පිළිබඳව අපේ පක්ෂයේ සභාපති මෛත්‍රීපාල සිරිසේන මහත්මා දැනටමත් විවිධ මට්ටමේ සාකච්ඡා සිදු කරමින් ඉන්නවා. අපිට විශ්වාසයක් තියෙනවා ඇයත් අපිත් එක්ක එකතු වේවි කියල. ඒ විතරක්ම නොවෙයි පොහොට්ටුව නියෝජනය කරන බහුතරයක් ශ්‍රීලනිපයට සම්බන්ධ අයයි. ඒ හැම දෙනාමත් අපි නැවත ශ්‍රීලනිපයට එකතු කර ගන්න වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරලයි තියෙන්නෙ. විශේෂයෙන් ගම්මට්ටමේ අපේ පාක්ෂිකයන් දිවයින පුරාවට නැවැත ශ්‍රීලනිපය වටා එකතු කර ගැනීමට අපි කටයුතු කර ගෙන යනවා.

**ඔබලා ශ්‍රීලනිපයට නැවත එකතුවීමට එරෙහිව ශ්‍රීලනිපය තුළම විරෝධයක් එල්ල වී තියෙනවා නේ ද?**

ඔබ අවස්ථා කීපයකදීම කීවා අපි නැවත ශ්‍රීලනිපයට එකතු වුණා කියල. ඒක වැරැදියි. අපි නැවැත ශ්‍රීලනිපයට එකතු වෙන්න නම් අපි ශ්‍රීලනිපය දාලා යන්න ඕනේ. අපි කවදාවත් ශ්‍රීලනිපය දාලා ගියේ නෑ. අපි දැන් අපේ මහ ගෙදරට ඇවිල්ල ඉන්න එක ගැන සමහර අයට ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. මොකද අපි කවදාවත් ශ්‍රීලනිපය දාලා වෙන වෙන තැන්වලට ගිය අය නොවෙයිනෙ. නමුත් ශ්‍රීලනිපයේ සභාපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඉතාම ඉවසීමෙන් මේ පක්ෂය ආරක්ෂා කරන්න කටයුතු කර තියෙනවා. එතුමා මැදිහත්ව තීරණ ගැනීම නිසා ශ්‍රීලනිපයෙන් ඈත් වූ පිරිස් නැවත පක්ෂයට එකතු වෙමින් ඉන්නවා. ඒ නිසා කවුරු මොන විදියට හිතුවත් අපි මේ පක්ෂයේ ඉදිරි ගමන ශක්තිමත් කරගන්න අවශ්‍ය වැඩපිළිවෙළ සභාපතිවරයක් එක්ක එකතුව කර ගෙන යනවා.

**දැන් ඔබ ඇතුළු කණ්ඩායම ආණ්ඩුවත් එක්ක ඉන්නවා. ජනාධිපතිවරණයක් ගැනත් කතාබහක් ඇතිව තියෙනවා. ජනාධිපතිවරණයට රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් වුණොත් ඔබලත් එතුමටද සහය දෙන්නෙ?**

අපි ආණ්ඩුව ඇතුළේ හිටියට අපි ඉන්නෙ ජනාධිපතිවරයා සමග පමණයි. ඒක විශේෂයෙන් සඳහන් කරන්න ඕනේ. ආණ්ඩුව හදා ගත්තෙ පොහොට්ටුවේ අය කියලනේ කියන්නෙ. නමුත් අපි පොහොට්ටුවේ කණ්ඩායම එක්ක නොවෙයි ඉන්නෙ. අපේ සහාය තිබෙන්නෙ ජනාධිපතිවරයාට පමණයි.

**හරි මම ඇහුවේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණොත් ඔබලා සහය දෙන්නෙත් එතුමට ද?**

ජනාධිපතිවරණයක් ගැන කතාබහ කළාට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මීළඟ ජනාධිපතිවරණයට අපේක්ෂකයෙක් විදියට ඉදිරිපත් වෙනවද කියල තාම කියල නෑ. දැන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ කටයුතු කරන්නෙ ස්වාධීන පුද්ගලයෙක් විදියටයි. එතුමා මෙවර එජාප මැයි රැළියට ගියෙත් නෑ. ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් කළාට පස්සෙ අපේ සහය දෙන්නෙ කාටද කියල අපි පක්ෂය ඇතුළෙත් කථා කරල තීන්දුවක් ගන්නවා. දැනට අපේ ඉන්න දේශපාලන නායකයන් අතර පරිණත අභියෝග බාර ගත හැකි වගකීම් දල දුවන්නෙ නැති පරිණත නායකයෙක් කියල රනිල් වික්‍රමසිංහ මේ වන විට ඔප්පු කර තියෙනවා. ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කළාට පස්සේ ඒ වෙනුවෙන් අපි සාධාරණ ඉටු කරනවා.

**මේ වෙද්දි යම් යම් භාණ්ඩවල මිල අඩුවුණත් ඒ වාසිය සාමාන්‍ය ජනතාවට ලැබිල නෑ. උදාහරණයකට තෙල් මිල අඩුවීම, ගෑස්මිල අඩුවීම, පාන්පිටි මිල අඩුවීම වගේ දේවල්. ඔබ හිටපු පාරිභෝගික කටයුතු රාජ්‍ය ඇමැතිවරයා. දැන් ප්‍රවාහන රාජ්‍ය ඇමැතිවරයා. ඉන්ධන මිල අඩුවීමේ සහනය ජනතාවට ලැබෙන්නෙ කවදා ද?**


ඔබ කියන කාරණයේ යම් සත්‍යතාවක් තිබෙනවා. අපි පිළිගන්න ඕනේ 2022 ට වඩා දැන් ජීවන වියදම අඩුවී තියෙනවා කියල. මේ වන විට භාණ්ඩ මිල තීරණය වෙන්නෙ වෙළෙඳ පොළ හැසිරීම අනුවයි. ඒ නිසා ආණ්ඩුවට මිල පාලනය සාර්ථකව කර ගන්න නොහැකිවී තිබෙනවා. 2022 වසරට සාපේක්ෂව මේවන විට හැම භාණ්ඩයකම මිල යම් යම් ප්‍රමාණයන් ගෙන් අඩු වී තිබෙනවා. ඔබ කිව්ව විදියට ගෑස්, ඉන්ධන, මිල ගණන් මේ වන විට ඉතා විශාල ලෙස අඩුවී තියෙනවා.

සමහර ආහාරවල මිල අඩු වීම සිදු වන්නේ ඉතාම සෙමින්. මාළු මිල වාරකන් කාලයට වැඩි වීම සාමාන්‍ය දෙයක්. එළවළු මිලත් එහෙමයි. නමුත් සාමාන්‍ය ආහාර ද්‍රව්‍යවල මිල අනෙක් ද්‍රව්‍යවල මිල පහත වැටී ඇති තත්ත්වයට සාපේක්ෂව පහත වැටී නෑ. ඒ ගැනත් රජය අවධානය යොමු කරමින් අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා.

**ඔබත් නියෝජනය කරන පාර්ලිමේන්තු කෝපා කමිටුවේ දී විවිධාකාරයේ හෙළිදරව් කර ගැනීම් සිදු වෙනවා. නමුත් ඒවායේ අවසන් ප්‍රතිඵලය මොකක් ද?**

කෝපා කමිටුවේ දී හෙළිදරව් වන රාජ්‍ය ආයතනවල නාස්තිය දූෂණය වළක්වා ගැනීමට අපි නිර්දේශ සහිත වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ අනුව අදාළ ආයතන අයත් වන අමාත්‍යාංශයේ ලේකම්වරයා හා අමාත්‍යවරයා ඒ නිර්දේශ ක්‍රියාත්මක කරන්න බැඳී ඉන්නවා. ඒ විතරක් නොවෙයි ඒ නිර්දේශ සම්බන්ධයෙන් ඒ ඒ අමාත්‍යාංශය ගත් ක්‍රියාමාර්ග පිළිබඳව සති අටක් ඇතුළත අදාළ අමාත්‍යවරයා පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරන්නත් ඕනේ. මේ තත්ත්වය නිසා රාජ්‍ය ආයතනවල සිදුවන නාස්තිය දූෂණය හොරකම් යම් තරමක් දුරට වැළකී තියෙන බව පේන්න තියෙනව. මේ යහපත් වෙනස්වීම් තවදුරටත් ශක්තිමත් කරගන්න තමයි අපි උත්සාහ කරන්නෙ. පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවට මේ වන විට වසර සීයක් ගතව තියෙනවා. ඉතිහාසයේ මේ කාරක සභාවට සිදු වුණේ විමර්ශනය කරන්න විතරයි. නමුත් 2022 සිදුකළ සංශෝධනය නිසා මෙම කමිටුව සිදුකරන විමර්ශනවලින් හෙළිදරව් වෙන කාරණා සම්බන්ධයෙන් අදාළ විෂය බාර අමාත්‍යවරයා එකී තත්ත්වයන් වළක්වා ගන්න පියවර ගත යුතුවාක් මෙන් ම එසේ ගනු ලැබූ පියවරයන් ගැන පාර්ලිමේන්තුවට වාර්තා කරන්න ඕනේ. අවාසනාවකට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අදාළ අමාත්‍යවරුන් ගේ වාර්තාවල අන්තර්ගතයට මාධ්‍යයෙන් ප්‍රචාරයක් ලැබෙන්නේ නෑ.

■ සංවාදය - ජයසූරිය උඩුකුඹුර




## ගපිරිගේ කවිය

### ඕ.ටී. කරන අලුත් විදිය

බැරි තැන ආණ්ඩුවෙ පඩියෙන් රැකෙන්න
ගණිකා වෘත්තියෙන් මුදලක් හොයන්න
කාර්යාලවල ගැහැණුන් වැටෙන්න
හේතුව එපා ගරු මහතුනි අහන්න

ඊයෙත් අහුවෙලා ඕ.ටී. කරන හැටී
බම්බලපිටියෙ එක එක පොට්වලට වැටී
ගේ දොර වැඩට, දරුවන්හට ගන්න පිටී
අම්මල මැරෙන හැටි රට දැනගන්න වටී

# අනුරාධපුරයට ආවේණික නව නීති පද්ධතියක් හදනවා

## සැලසුම හරි ගියොත් ලංකාව පුරාවිද්‍යා කේන්ද්‍රස්ථානයක් වේවී

### - ජනපති අනුරාධපුරයේදී කියයි



ජනාධිපතිවරයා අටමස්ථාන පුදබිම නිරීක්ෂණය කරමින්....

**අනුරාධපුරයේ ඓතිහාසික උරුමය සුරැකීම සඳහා ඊට ආවේණික නව නීති පද්ධතියක් ගෙනෙන බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ පැවසීය.**

ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේ මහා විහාර සංවර්ධන සැලැස්ම සහ අනුරාධපුර පූජා භූමි සංවර්ධන සැලැස්ම පිළිබඳව අනුරාධපුර බෝමළු විහාරයේ පෙරේදා (22 වැනිදා) පස්වරුවේ පැවැති සාකච්ඡාවට එක්වෙමිනි.

ජනාධිපතිවරයා එහිදී මෙසේ ද පැවසීය.

"මේ මහා විහාර සංවර්ධන සැලැස්ම මුල් කරගෙන අනුරාධපුර පූජා භූමියේ අනෙකුත් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කළ යුතුයි. අනුරාධපුර පූජා භූමියේ සංවර්ධන කටයුතු ආරම්භ වූයේ 1947 බණ්ඩාරනායක මැතිතුමාගේ සමයේදියි. නමුත්, අද වන තෙක් මෙය සාර්ථකව අවසන් කිරීමට අප සමත් වී නැහැ.

නමුත්, ඉන්දියාව නාලන්ද විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් ආරම්භ කළේ 90 දශකයේදීයි. අද නාලන්ද විශ්වවිද්‍යාලය ප්‍රධාන ස්ථානයක් ලෙස ගොඩනගා තිබෙනවා. රටවල් ගණනාවක් ඊට දායක වුණා. මුස්ලිම් රටක් වූ පාකිස්තානයත් තක්ෂිලාව එලෙස ගොඩනැගුවා. ශ්‍රී ලංකාව බෞද්ධ රටක් වුවත් මහා විහාරයේ වැඩකටයුතු අවසන් කිරීමට අපට හැකි වී නැහැ. අප කවුරුත් ඒ පිළිබඳව ලැජ්ජා විය යුතුයි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මට ලිපි එවනවා පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කර දෙන්න කියලා. අපි ඒ සඳහා සූදානම්. නමුත්, මේ මහා විහාරයේ කැණීම් කටයුතු මූලික කර ගෙන අප ඉදිරියට යා යුතුයි. අටමස්ථානයේ මහා සංඝරත්නයේ අනුශාසනා මත මෙම කටයුතු ඉදිරියට ගෙන යා යුතුයි.

අනුරාධපුරයට බලපාන පරිදි නව නීතියක් සකස් කළ යුතුයි. ඒ වගේම අදාළ නිලධාරීන් සමග මේ වැඩකටයුතු ඉදිරියට ගෙන යෑමට කමිටුවක් පත් කිරීමට අපේක්ෂා කරනවා. දෙපාර්තමේන්තු, සංස්ථා තිබුණත් මෙම කටයුත්ත භාරව එක් පරිපාලන නිලධාරියෙක් නැහැ. ඒ පිළිබඳව ද අපේ අවධානය යොමු විය යුතුයි. මෙම ව්‍යාපෘතිය අපි දැන් ආරම්භ කළොත් ඉදිරි වසර 10දී යම් ප්‍රගතියක් අත්පත් කර ගන්න පුළුවන් වුවත්, මෙය සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට අඩුම තරමින් වසර 25ක්වත් ගත වෙනවා. මෙම කටයුතු ආරම්භ කළ විට ශ්‍රී ලංකාව පුරාවිද්‍යා කේන්ද්‍රස්ථානයක් බවට පත්වෙනවා. එවිට මේ ගැන සොයා බලන්න අනිත් අය ඉදිරිපත් වෙනවා.

රජරට විශ්වවිද්‍යාලයත් මීට සම්බන්ධ කළ හැකියි. සංචාරකයන් දින කිහිපයක් මෙහි රඳවාගත හැකි අයුරින් මෙම ප්‍රදේශය දියුණු කළ යුතුයි. ඒ නිසා මෙම වැඩසටහනට ප්‍රමුඛත්වය ලබාදී ඉදිරියට ගෙන යා යුතුයි. මෙය ආරම්භ කළ විට එම කටයුතු ඉදිරියට ගෙන යෑමට ජාත්‍යන්තරයේ සහාය අපට ලැබෙනවා. මෙහි රජරට ශිෂ්ටාචාරය කියලා වෙනම ප්‍රදර්ශනාගාරයක් ඇති කිරීමට අප බලාපොරොත්තු වෙනවා. බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳවත් වෙනම ස්ථානයක් ඇති කළ යුතුයි."

### මග හැරුණු තැන් සකසා පුළුල් සැලසුමක් හදන්න

#### - අටමස්ථානාධිපති හිමි

**නුවර කලාවියේ ප්‍රධාන සංඝනායක හා අටමස්ථානාධිපති පල්ලේගම හේමරතන නාහිමියෝද එහිදී මෙසේ අදහස් දැක්වූහ.**

"1948දී බණ්ඩාරනායක මැතිතුමා අනුරාධපුර පූජා භූමිය ගැසට් කරලා සංවර්ධනය කළා. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා මධ්‍යම සංස්කෘතික අරමුදල සමග එක්ව ජේතවනාරාමය හා අභයගිරිය විහාර පිළිසකර කළා. නමුත්, අටමස්ථානයේ අනෙක් විහාර සංකීර්ණ පිළිබඳව කාගේවත් අවධානය මෙතෙක් යොමු වෙලා නෑ.

අනුරාධපුර පූජා භූමි සංවර්ධන සැලැස්මේ ලංකාරාමය පිළිබඳ අවධානයක් යොමු වී නැති බව පෙනෙන්නට තිබෙනවා. ඒ නිසා මම භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හා මධ්‍යම සංස්කෘතික අරමුදලට මතක් කරනවා සති දෙකක පමණ කාලයකදී ලංකාරාම සංවර්ධනයට නිසි සැලසුමක් සකස් කර අනුරාධපුර පූජාභූමි සංවර්ධන සැලැස්මට ඇතුළත් කරන ලෙස. එසේ නොවුණහොත් මෙම අනුරාධපුර පූජා භූමි සංවර්ධන සැලැස්ම මූලික වශයෙන්ම අසාර්ථකත්වයට පත් වෙනවා. ඒ වගේම රුවන්වැලි සෑය ගැන කතා කරන විට, මහා විහාර පිරිවෙන තිබෙන භූමිය මග හැරුණා. එම භූමියත් මේ පරිශ්‍රයටම අදාළ භූමියක්. එබඳු මග හැරුණු තැන් සකස් කර මීට වඩා පුළුල් සැලසුමක් සකස් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම මේ අනුරාධපුර පූජා භූමිය අනාගතය සඳහා ආරක්ෂා කර ගැනීමට සුදුසු, මේ බිමට ආවේණික නීති රීති පද්ධතියක් සකස් කර ගැසට් කළ හැකි නම් එය ඉතා ජාතික වැදගත්කමක් ඇති කාර්යයක් ලෙස මම දකිනවා."

---

### ත්‍රිරෝදය යතුරුපැදියේ ගැටී

# ආනන්දයේ සිසුවෙක් මරුට

## පියා හා සොයුරා රෝහලේ



මිය ගිය සිසුවා

■ එෆ්. අස්ලම්

දෙල්ගොඩ, උඩුපිල, මාවරමංඩිය ප්‍රදේශයේදී ත්‍රිරෝද රථයක් හා යතුරුපැදියක් එකිනෙක ගැටී පෙරේදා (22 වැනිදා) රාත්‍රියේ සිදුවූ අනතුරකින් 09 හැවිරිදි පාසල් සිසුවකු මියගොස් ඇති අතර, ඔහුගේ පියා සහ වැඩිමහල් සොහොයුරා තුවාල ලබා රාගම ශික්ෂණ රෝහල වෙත ඇතුළත් කර තිබේ.

අනතුරින් මියගොස් ඇත්තේ කොළඹ ආනන්ද විද්‍යාලයේ සිව්වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ නිසල පන්සිලු නිම්නද සිසුවාය.

මියගිය සිසුවා සහ ඔහුගේ සොහොයුරා සිය පියා සමග යතුරුපැදියේ ගමන් කරසිටියදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ත්‍රිරෝද රියේ ගැටී අනතුර සිදුව තිබේ. ඉන් බරපතළ තුවාල ලත් යතුරුපැදිකරු සහ දරු දෙදෙනා උඩුපිල රෝහල වෙත ඇතුළත් කිරීමෙන් පසු 09 හැවිරිදි දරුවා මියගොස් ඇත. මෙම අනතුර සම්බන්ධයෙන් ත්‍රිරෝද රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, වැලිවේරිය ප්‍රදේශයේ පදිංචිකරුවකු වන ඔහු පාපන්දු උපදේශකවරයෙකි.

ත්‍රිරෝද රථ රියදුරුගේ අපරීක්ෂාකාරී ධාවනය හේතුවෙන් අනතුර සිදුව ඇතැයි මීගහවත්ත පොලිසිය පැවසීය.

සැකකරු ඊයේ (23 වැනිදා) මහර මහෙස්ත්‍රාත් හමුවට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

### කොතලාවල සරසවි රෝහලේ

## අකුණු සන්නායකවල තඹ පටි උස්සලා

■ තිස්ස රවින්ද්‍ර පෙරේරා

බොරලැස්ගමුව, වේරහැර පිහිටි කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය රෝහලේ ගොඩනැගිලි දහයක සවිකර තිබූ අකුණු සන්නායකවල තිබූ රුපියල් හැටපන්ලක්ෂ අනූහත්දහසක් වටිනා තඹ පටි කපා ගෙනගොස් ඇති බවට බොරලැස්ගමුව පොලිසියට පැමිණිල්ලක් ලැබී ඇත. එම රෝහලේ සේවය කරන නාවික හමුදා ලුතිනන් කේ.ඩී. ගොඩකන්ද විසින් අදාළ පැමිණිල්ල සිදුකර ඇත.

විශේෂ ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන එම රෝහලේ සිදුව ඇති මෙම තඹ කම්බි සොරකමට රෝහල් සේවකයන් සහාය දී ඇද්ද යන්න සෙවීමට පොලිසිය පරීක්ෂණ සිදුකරයි.

# පඬුකරඳ පැළ 100ක් බෝකරලා

## ගම්පහ තව මහ ගස් හතක්

## වැඩුණු ගස් වටා කුඩා පැළ රැසකුත් අතුවලිනුත් පැළ බෝකරනවා

### - පේරාදෙණිය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කියයි

■ සාලිය කුමාර ගුණසේකර

'කෘඩියා සෙලනිකා' (පඬුකරඳ) වර්ගයේ විශාල වැඩුණු ශාක හතක් හඳුනාගෙන ඇතැයි පේරාදෙණිය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය අචලා අත්තනායක පැවසුවාය.

යම් යම් පුද්ගලයින් ලබාදුන් තොරතුරු මත බෙම්මුල්ල, මගලගොඩ ප්‍රදේශය ආශ්‍රිතව මෙන්ම හැන්ඩිමහර, දෙරනගොඩ, බියගම, කදිරාන සහ මල්වාන ආදී ප්‍රදේශ වලදී එකී වැඩුණු ශාක හඳුනාගෙන ඇතැයි ද ඇය සඳහන් කළාය.

ජනාධිපති මාධ්‍ය කේන්ද්‍රය විසින් පසුගියද පැවැත්වූ වැඩසටහනකදී නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය මේ බව කීවාය.

වඳවීයාමේ තර්ජනයට ලක්වීම හේතුවෙන් 2012 වසරේදී රතු දත්ත ලැයිස්තුවට 'කෘඩියා සෙලනිකා' ශාකය ඇතුළත් කර තිබේ. ශාක සම්බන්ධ පරේෂකයකු වන හිමේෂ් ජයසිංහ විසින් 2019 වසරේදී ගම්පහ, දරළුව දුම්රිය ස්ථානය ආසන්නයේ තිබී එම වර්ගයේ ශාකයක් හඳුනාගෙන තිබිණි. එම ශාකය ඉකුත් ජූලි 10 වැනිද බැකෝ යන්ත්‍ර යොදගෙන උගුල්ලා වළදමා ඇතැයි පැවසේ.

'කෘඩියා සෙලනිකා' වර්ගයේ එම වැඩුණු ශාක හත පිහිටි ස්ථාන ආශ්‍රිතව තවත් කුඩා ශාක පැළවී තිබෙන ස්ථාන පහක් ද ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නිරීක්ෂණය කර තිබේ. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් මෙම ශාකයේ පැළ 100ක් පමණ මේ වනවිට බෝකර ඇත. ඒවායේ අතුවලින් පැළ ලබා ගැනීමේ හැකියාව පවතින බැවින් ඉදිරියේදී එම අතු වලින් ද පැළ බෝ කරන බව උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය වැඩිදුරටත් පැවසුවාය.

'කෘඩියා සෙලනිකා' මෙරටට පමණක් ආවේණික ශාකයක් වූවද, 'කෘඩියා' ඝනයේ ශාක දකුණු ඇමෙරිකාව හා දකුණු අප්‍රිකාව ආදී රටවල තිබෙන බව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පවසයි.

# වළ දැමූ පඬුකරඳ ගස ගොඩගන්න නියෝග

දරළුව ප්‍රදේශයේ තිබූ බව කියන වඳ වීයාමේ තර්ජනයට ලක්ව ඇති දුර්ලභ ශාක විශේෂයකට අයත් පඬු කරඳ (කෘඩියා සෙලනිකා) ගස වළ දමා ඇති ස්ථානය ස්ථිරවම හඳුනාගෙන වහාම එය ගොඩගන්නා ලෙස ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් ෆාතිමා සහානා මහ්ජි ගම්පහ දිසා වන නිලධාරි ඉසුරු අලවත්තට ඉකුත් 21 වැනිද නියම කළාය.

හොරෙන් කපා වළ දමා ඇතැයි පැවසෙන එම පඬු කරඳ ගස යළි ගොඩ ගන්නා තුරු එම ප්‍රදේශයට වහාම පොලිස් ආරක්ෂාව සපයන ලෙසද මහෙස්ත්‍රාත්වරිය බෙම්මුල්ල පොලිසියට නියම කළාය.

මෙම ගස කපා දැමූ ස්ථානය පිළිබඳව මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමු පියවරේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා දැනුවත්ව සිටි හෙයින් එය වළ දැමූ ස්ථානය නිශ්චිතව හඳුනාගැනීම සඳහා කටයුතු කරන්නැයි දිසා වන නිලධාරියාට නියම කළ මහෙස්ත්‍රාත්වරිය උදාසීනත්වයකින් තොරව වහාම මේ සඳහා ක්‍රියාත්මක වීමට ද නියම කළාය.

මෙම ගස සංරක්ෂණය කරන බවට මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමු පියවරේ නිලධාරීන් අභියාචනාධිකරණයට පොරොන්දු වී තිබෙන බවත් ඒ සම්බන්ධයෙන් අභියාචනාධිකරණය දුන් තීන්දුවට පිටුපාමින් කැබිනට් තීරණයක් අනුව යැයි කියමින් විනාඩි අටක් වැනි කෙටි කාලයකදී දුර්ලභ පඬු කරඳ ගස හොරෙන් කපා වළ දමා ඇති බවත් කියමින් පුරාවස්තු සුරැකීමේ සංවිධානයේ සභාපති උඩස්ගිරියේ සමිත හිමියන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා කළ කරුණු සලකා බැලීමෙන් පසු මහෙස්ත්‍රාත්වරිය මෙම නියෝගය කළාය.

වඳවීයාමේ තර්ජනයට හසුව තිබෙන මෙම ගස හඳුනාගෙන එය ඉවත් කිරීමට සූදානම් වු අවස්ථාවේ දී එම ප්‍රදේශයේ පදිංචිකරුවකු ඊට එරෙහිව අභියාචනාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ බව ද පැමිණිල්ලේ නීතිඥවරයා දැනුම් දුන්නේය.

එම අවස්ථාවේ පැමිණිලිකාර ගම්පහ දිසා වන නිලධාරියා ඇමතූ මහෙස්ත්‍රාත්වරිය කැබිනට් තීරණයකට අනුව මෙම ගස කපා ඉවත් කරන බව දැනුම් දුන්නේද යන්න විමසුවා ය.

ඊට පිළිතුරු දුන් නිලධාරියා කියා සිටියේ කැබිනට් තීරණයක් අනුව ගස කපා ඉවත් කළ බව පළමු පියවරේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා දැනුම් දුන් බව අතිරේක වන සංරක්ෂක ජනරාල්වරයා විද්‍යුත් තැපැල් මගින් දැනුම් දුන් බවයි.

කපා වළ දමා ඇති මෙම ගස යළි ගොඩගැනීමට හැකියාවක් පවතින්නේ දැයි මහෙස්ත්‍රාත්වරිය කළ විමසුමට පිළිතුර දුන් නිලධාරියා සඳහන් කළේ ඒ සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර දිසා වන කාර්යාලයේ නොමැති බවයි.

පැමිණිල්ල අද (24 වැනිද) යළි කැඳවීමට ද මහේස්ත්‍රාත්වරිය නියම කළාය.

# ලාදුරු බේත් වලිනුත් ගසා කාලා

### - සෞඛ්‍ය වෘත්තියවේදීන්ගේ විද්වත් සංගමය

■ චාමර පල්ලේගෙදර

ලාදුරු රෝගයට ප්‍රතිකාර කිරීමට භාවිත කරන ඩැප්සෝන් (Dapsone) නමැති ඖෂධය මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියකදී වංචාවක් සිදුව ඇති බව සෞඛ්‍ය වෘත්තියවේදීන්ගේ විද්වත් සංගමය පවසයි.

මිලිග්‍රෑම් 50ක් බරැති පෙති 100ක් අඩංගු මෙම ඖෂධ පැකට්ටුවක් ඇමරිකානු ඩොලර් 58.33කට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මිලදී ගෙන ඇත. එම ඖෂධයම මිලිග්‍රෑම් 25ක් බරැති පෙති 30ක පැකට්ටුවක් මිලදී ගෙන ඇත්තේ ඇමරිකානු ඩොලර් 490ට බව ද එම සංගමයේ සභාපති රවී කුමුදේශ් පැවසීය.

මේ පිළිබඳව විමර්ශනයක් සිදු කරන ලෙස ඔහු සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටියි.

මේ අතර, ප්‍රමිතියෙන් තොර බාල ඖෂධ භාවිතය සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් ආරම්භ කිරීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව තීරණය කර තිබේ.

විගණකාධිපති ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න සඳහන් කළේ මෑතකදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව ජාතික විගණන කාර්යාලය සිදුකළ විමර්ශනවලදී ප්‍රමිතියෙන් තොර සහ ලියාපදිංචි නොකළ ඖෂධ භාවිතය සම්බන්ධයෙන් තොරතුරු රැසක් අනාවරණය වූ බවයි.

---

## ග්‍රහචාරය

**2023-ජූලි මස 24 වැනිදා සඳුදා**

**රාහු කාලය**
උදේ 7.36 - උදේ 9.10
රාත්‍රි 7.57 - රාත්‍රි 9.24

**සුබ දිශාව - දකුණර**
**මරු - වයඹ**

### මේෂ
**සෙමි ගති**

කැපී පෙනෙන අයුරින් වැඩ කිරීමට උනන්දුවක් දක්වනු ඇත. ඊට අවශ්‍ය හැකියාවද බුද්ධිමත්ව මෙහෙයවීමට ඉඩ ලැබෙනු ඇත. පපුවේ තද ගති මෙන්ම වියළි සෙම තත්ත්වයන් පාලනය කර ගන්න.

### වෘෂභ
**යහපත් ඵල**

නිවාස සම්බන්ධ කටයුතුවල නිරතවීම එතරම් පහසුවක් ගෙන නොදේ. පැටළිලි තත්ත්වයක් ඇතිවේ. තරගකාරී කටයුතු ඇතත් එතරම් යහපත් ඵල නොදැදෙන සුළු වේ. සුභ වැඩ කටයුතුවලට දක්වන උනන්දුව වැඩිවේ.

### මිථුන
**පාඩු සහිතයි**

එදිනෙද වැඩකටයුතුවලදී කතාබස් විලාශයන් පාලනය කරගන්න. පාඩු ඇති කළ හැකිය. පවුලේ කටයුතු වෙනුවෙන් උනන්දු වන අතර ඒ සඳහා සංවාදයන් ද ඇති කළ හැකිය. ඔබගේ පුද්ගලික උනන්දුව කැපී පෙනෙනු ඇත.

### කටක
**උනන්දු බවක්**

තරගකාරී වැඩවලට උනන්දුවක් ඇති කෙරේ. තම අභිමානය සම්බන්ධව විශේෂ අවධානයක්ද යොමු කරවනු ඇත. මූල්‍ය ක්ෂේත්‍රයේ වැඩකරන අයට මිල මුදල් පරිහරණය වැඩිවිය හැකිය. ගමන් බිමන්ද සාපේක්ෂව ඇති වේ.

### සිංහ
**ක්‍රියාශීලී බවක්**

තම ශක්තිය අනියම් අයුරින් යොමුකිරීමේ උනන්දුවක් ඇති වේ. කඩිසර හා ක්‍රියාශීලී බවක් ද පෙනේ. තරගකාරීත්වයට වැඩි කැමැත්තක් දක්වනු ඇත. කතා බහ ඉතා මෘදු වන අතර ඔබට වඩා අන් අයට එහි ප්‍රයෝජන අත්වේ.

### කන්‍යා
**බාධක මග හැරේ**

බාධක මග හැරවීමට හා ඉන් තම ප්‍රතිලාභ තත්ත්වයන් තහවුරු කරගැනීමට හැකිවේ. හැසිරීම් රටාව බොහෝදුරට අන්‍යයන් පිනවන සුළුවේ. ඇස්වල අමාරුකම්, වැටීම් තැළීම් සම්බන්ධව ප්‍රවේශම් විය යුතු වේ.

### තුලා
**හිත් රිදවීම්**

විනෝද හෝ රසකෑම, රූපලාවන්‍ය කටයුතුවලින් යහපත් ප්‍රතිඵල ලැබීමට ඉඩ ඇතත් යම් යම් අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවේ. රැකියාවේ කටයුතුවලදී හිත් රිදවීම් ගැන ඉවසීමෙන් කටයුතු කරන්න. රාජ්‍ය සේවා සබඳතාවලදී විශේෂයි.

### වෘශ්චික
**කාර්යබහුල වේ**

රාජ්‍ය සේවාවන් හා සම්බන්ධ රැකියාවන්හි නියුතු අයට කාර්යබහුල වේ. එහෙත් කලාත්මක කටයුතු හා සම්බන්ධ නම් යම් යම් සංකීර්ණතා ඇති කළ හැක. එහෙත් ජන්ම හෝ හුරු වූ දක්ෂතාවන්ගෙන් එල ප්‍රයෝජන අත්වේ.

### ධනු
**පෞරුෂ බලය**

තම පෞරුෂ බලය තවදුරටත් රැකගෙන වැඩකිරීමට හැකිවේ. රැකියා ස්ථානයේ සුහදතාව මනාව පාලනය කර ගැනීමට හැකිවේ. භූමි (ඉඩම්) කටයුතුවල අයිතීන් සම්බන්ධ ගැටලුවලට සහනයක් ලැබෙනු ඇත.

### මකර
**ආගමික සබඳතා**

කතාබහ පාලනයක් අවශ්‍යයි. උසස් අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ ලැබෙනු ඇත. සමූහ මෙන්ම විවාහ සම්බන්ධ කටයුතු වඩාත් සුහදශීලීව පාලනය කරගත හැකි වේ. ආගමික සබඳතාවක්ද ඇති කළ හැකිය.

### කුම්භ
**හිත් අමාරුකම්**

තම අභිමතය පරිදිම කටයුතු කිරීම යම් යම් අපහසුතාවලට හේතු විය හැකිය. සාමූහික සබඳතාවන් යහපත් වුවත් හිත් අමාරුකම්වලට ඉන් ඇතිවිය හැක ජලය (විශේෂයෙන් විවෘත ජලාශ) සම්බන්ධ කටයුතු ගැන ප්‍රවේශම් වන්න.

### මීන
**විවාහ යෝජනා**


මිල මුදල් පරිහරණය සාමාන්‍යයෙන් යහපත් වන අතර මුදල් තැන්පතුවලද ශුභදායක වේ. විවාහ යෝජනා හා අන්‍යෝන්‍ය සබඳතාවන් ඉතා යහපත් වේ. උගත් හා දැනුමැති අය ඇසුරුකමටද ඉඩ ලැබේ. උදරාගත උෂ්ණාධික තත්ත්වයන් පාලනය කරගන්න.

# කාබන් වෙළෙඳුමට බැස්සොත් යාලෙන් විතරක් හොඳ ලාබයක්



■ සාලිය කුමාර ගුණසේකර

කාබන් වෙළෙඳම ක්‍රියාත්මක කිරීම මගින් යාල ජාතික වනෝද්‍යානයෙන් පමණක් වසරකදී ඇමරිකානු ඩොලර් මිලියන සියයක ආදයමක් ඉපයීමට හැකි බව පරිසර අමාත්‍යාංශය සඳහන් කරයි. ලෝකයේ සංවර්ධිත රටවලින් සිදුවන වායු දූෂණය නිසා හරිතාගාර වායු මුදහරින රටවලට යම් ගෙවීමක් කාබන් වෙළෙඳම හරහා සිදු කෙරේ. මේ වනවිට බංග්ලාදේශය ඇතුළු රටවල් කාබන් වෙළෙඳමට සම්බන්ධ වී සිටී. කාබන් වෙළෙඳමට අදළ මූලික සාකච්ඡා සිදු කරමින් පවතින බව පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ පැවැසීය.



# වසරකදී උඩරට එළවළු බීජ කිලෝ ලක්ෂයක් ආනයනය කෙරේ

■ සාලිය කුමාර ගුණසේකර

උඩරට එළවළු බීජ නිෂ්පාදනයට අදළ දේශගුණික තත්ත්වය මෙරට නොමැති බැවින් එම බීජ කිලෝග්‍රෑම් ලක්ෂයක් පමණ වාර්ෂිකව ආනයනය කරන බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහන් කරයි. රට තුළ නිෂ්පාදනය කළ හැකි බීජ වර්ග ආනයනය නොකර නිෂ්පාදනය කිරීමට කටයුතු කරන ලෙස කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පසුගියද උපදෙස් දුන්නේය.

ඒ අනුව රට තුළ නිෂ්පාදනය කළ හැකි බීජ වර්ග 2030 වනවිටදී රටට අවශ්‍ය ප්‍රමාණය සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කිරීමට කෘෂිකර්ම අංශ අවධානය යොමුකර ඇතැයි කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් පී. මාලතී කීවාය. පතෝල එළවළු බීජ අවශ්‍යතාවයෙන් 100%ක්, මැකරල් බීජ අවශ්‍යතාවයෙන් 93%ක්, කරවිල බීජ අවශ්‍යතාවයෙන් 89%ක්, වම්බටු බීජ අවශ්‍යතාවයෙන් 79%ක්, බෝංචි බීජ අවශ්‍යතාවයෙන් 64%ක්, බණ්ඩක්කා බීජ අවශ්‍යතාවයෙන් 61%ක්, මාළු මිරිස් බීජ අවශ්‍යතාවයෙන් 44%ක්, තක්කාලි බීජ අවශ්‍යතාවයෙන් 27%ක්, රාබු බීජ අවශ්‍යතාවයෙන් 39%ක් වශයෙන් බීජ නිෂ්පාදනය ආරම්භ කර තිබේ.

රටේ සමස්ථ එළවළු බීජ අවශ්‍යතාවය කිලෝ ග්‍රෑම් 800,000ක් පමණ වන අතර ඉන් උඩරට එළවළු සඳහා කිලෝ ග්‍රෑම් 100,000ක් ද පහතරට එළවළු සඳහා කිලෝ ග්‍රෑම් 700,000ක්ද ලෙස බීජ අවශ්‍යතාවය පවතී. මෙම බීජ අවශ්‍යතාවය දේශීය බීජ නිෂ්පාදනයෙන් හා ආනයනික බීජ මගින් සපයා ගනු ලැබේ.

# රාජගිරියේ ජනජය සිටි අසාර්ථක ව්‍යාපෘතියක් බව කෝප් කමිටුවේදී හෙළිවෙයි

■ නිලන්ත මදුරාවල

රුපියල් කෝටි පනස් පහක් වැය කරමින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව රාජගිරියේ ඉදිකර තිබෙන ජනජය සිටි සුපිරි වෙළෙඳ සංකීර්ණය සම්පූර්ණයෙන්ම අසාර්ථක ව්‍යාපෘතියක් බව අනාවරණය වී තිබේ. මේ බව අනාවරණය වී ඇත්තේ පසුගියද පාර්ලිමේන්තුවේ පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී (කෝප් කමිටුව)ය. මෙම වෙළෙඳ සංකීර්ණයේ මාසික නඩත්තුව සඳහා පමණක් මාසිකව රුපියල් කෝටියක පමණ මුදලක් වැය කිරීමට සිදුව තිබෙන බවත් එහිදී හෙළි වී ඇත.

මෙම සංකීර්ණය ඉදිකර ඇත්තේ රාජ්‍ය පාරිපාලන අමාත්‍යාංශය යටතේ ඇති දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණයකින් වන අතර මේ වනවිට එම ණය මුදල සම්පූර්ණයෙන්ම පියවා දැමීමට මහ නගර සභාව කටයුතු කර තිබේ. ණය මුදල පියවා ඇතත් ව්‍යාපෘතිය මහ නගර සභාවට බරක් වී තිබෙන බවට මෙහිදී සාකච්ඡාවට භාජනය වී ඇත. මෙම ණය මුදල අනුමත කිරීම සම්බන්ධයෙන් සලකා බලන ලෙස තමන් වරින් වර කළ ඉල්ලීම නොතකා ව්‍යාපෘතිය සඳහා ණය ලබා දීමට එම අරමුදල කටයුතු කළ බව මෙම කාරක සභාවට එක්ව සිටි කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රිවරයෙක් සඳහන් කර තිබේ.

පළාත් පාලන ආයතනවල සංවර්ධන ව්‍යාපෘති සඳහා පිහිටුවා ඇති මෙම අරමුදලෙන් මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් නොමැති බවට කෝප් කමිටු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බණ්ඩාර එහිදී චෝදනා කර තිබේ. එම අරමුදලේ සභාපති, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් රංජිත් අසෝක සඳහන් කර ඇත්තේ ප්‍රමුඛතාව ලබා දියයුතු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙළක් සකස් කරන බවය.

# සමාජවාදී තරුණ උද්ඝෝෂණයට ජල ප්‍රහාර



ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ සමාජවාදී තරුණ සංගමය කොළඹ ලිප්ටන් වටරවුම ප්‍රදේශයේ ඊයේ (23 වැනිද) පැවැත් වූ උද්ඝෝෂණය ජල ප්‍රහාර එල්ල කර විසුරුවා හැරීමට පොලිසිය පියවර ගත් ආකාරයයි මේ.

ඡායාරූපය - සමන් අබේසිරිවර්ධන

# විදේශිකයකු බේරා ගන්න මුහුදට පැන්න පාපන්දු ක්‍රීඩකයෙක් මරුට

■ ලක්බිත විද්‍යාසේකර - කලුතර

උතුරු කලුතර මුහුදේ ගිලෙමින් සිටි විදේශිකයෙකු බේරා ගැනීමට උත්සහ කරමින් සිටි 38 හැවිරිදි පාපන්දු ක්‍රීඩකයකු මුහුදේ ගිලී ඊයේ (23 වැනිද) මිය ගොස් ඇත. මෙසේ මිය ගොස් ඇත්තේ උතුරු කලුතර, දකුණු ශ්‍රී සුමංගල පාරේ පදිංචිව සිටි ගම්ලත්ගේ ධනුෂ්ක ප්‍රියදර්ශන නම් අයෙකි. ඔහු උතුරු කලුතර සුපර් බීච් ක්‍රීඩා සමාජය නියෝජනය කළ දක්ෂ පාපන්දු ක්‍රීඩකයෙකි.

ඔහු විසින් බේරා ගැනීමට උත්සාහ කළ විදේශිකයාද අසාධ්‍ය තත්ත්වයෙන් කලුතර නාගොඩ ශික්ෂණ රෝහලට ඇතුලත් කර තිබේ.

# ආනයනික ආහාරවල මිල වැඩිවන ලකුණු

■ චමින්ද සේනාරත්න

ගෝලීය දේශගුණ බලපෑම නිසා ඇතිවන ආහාර හිඟය හේතුවෙන් ඉදිරියේදී ආනයනික ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යා හැකි බව භාණ්ඩ ආනයනකරුවෝ පවසති. ගෙවුණු සති කිහිපයේදී ආසියා මහද්වීපයේ රටවලට ඇතිවූ දරුණු ගංවතුර හා නියඟය මෙම තත්ත්වයට බලපා තිබේ.

විශේෂයෙන් ඉන්දියාව, චීනය, පාකිස්තානය, බංග්ලාදේශය ආදී රටවලට දරුණු ගංවතුර තත්ත්වයන් ඇතිවිය. එම නිසා වගාබිම් විශාල ප්‍රමාණයක අපේක්ෂිත අස්වැන්න අහිමිවන බවට ලෝක ආහාර සංවිධානයේද අවධානය යොමුව ඇත. මේ හේතුවෙන් දැනටමත් ඉන්දියාව සිය සහල් අපනයනය නතර කර ඇති අතර බී ලූණු මිලද ඉහළ ගොස් තිබේ.

මෙම තත්ත්වය යටතේ ඉදිරි මාස දෙක තුනේදී අල, කඩල, ලූණු, මිරිස් හා කුළුබඩු ආදියේ මිල ඉහළයාමේ අවදනමක් මතුව ඇති බව ආනයනකරුවන් පවසති.



# ව්‍යාජ හැඳුනුම්පතක් සාදා ඉඩමක් විකිණූ 4ක් කොටු

■ කමල් සුරවීර - මහනුවර

මහනුවර ධර්මරාජ විදුහල ආසන්නයේ පීරිස්වත්ත ප්‍රදේශයේ වටිනා ඉඩමක හිමිකරුවකුගේ නමින් ව්‍යාජ හැඳුනුම්පතක් සකස් කර එහි හිමිකරු ලෙස පෙනී සිටිමින් අදළ ඉඩම රුපියල් ලක්ෂ 40කට විකුණූ පුද්ගලයින් සිව් දෙනෙකු මහනුවර පොලිසියේ විශේෂ අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් සැකපිට අත්අඩංගුවට ගනු ලැබීය. අදළ ඉඩමේ සැබෑ හිමිකරු එම ඉඩම විකිණීමේ අරමුණින් එහි ඔප්පුවේ පිටපතක් හිතවතෙකුට ලබා දී තිබෙන බවත් එම පිටපතේ සඳහන් නමට ව්‍යාජ හැඳුනුම්පතක් සකස්කර සැකකරුවන් මීගමුව ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකුට ඉඩම විකුණා තිබෙන බවත් පොලිසිය පවසයි.

ව්‍යාජ හැඳුනුම්පත නීතිඥයකු වෙත ඉදිරිපත් කර ඉඩම නව හිමිකරුට ලිවීමේ කටයුතු සිදුකර තිබෙන අතර ඒ වෙනුවෙන් රුපියල් 280,000ක නීතිඥ ගාස්තුවක් ගෙවා තිබේ. ඉඩම ලියාපදිංචි කිරීමට ගිය අවස්ථාවේ එහි සිටි නිලධාරියෙකුට සැකසිතී ඒ බව නිතීඥයාට සහ ඉඩම මිල දී ගත් පුද්ගලයාට දැනුම් දීමෙන් පසු ඔවුන් ඒ සම්බන්ධව සැලකිලිමත් වී සිදුකළ සොයා බැලීමේ දී ඉඩමේ සැබෑ හිමිකරු හමු වී ඇත. තමන්ගේ ඉඩම ව්‍යාජ හැඳුනුම්පතක් උපයෝගී කර ගනිමින් මෙලෙස අලෙවි කර තිබෙන බව ඒ වනවිටත් නොදැන සිටි ඉඩමේ සැබෑ හිමිකරු ඒ සම්බන්ධයෙන් මහනුවර පොලිසියේ විශේෂ අපරාධ විමර්ශන අංශයට පැමිණිල්ලක් සිදුකර ඇත. ඒ ඉඩම මිල දී ගත් ව්‍යාපාරිකයා සමග ගොස්ය.

සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ කළ පොලිසිය ඉඩම මිලට ගත් පුද්ගලයා මුදල් බැර කළ ගිණුම් පරීක්ෂා කිරීමේ දී අනාවරණය වී ඇත්තේ එක් සැකකරුවකු ව්‍යාජ හැඳුනුම්පත උපයෝගි කර ගනිමින් බැංකු ගිණුම විවෘත කර තිබෙන බවය. සැකකරුවන් ලක්ෂ 36ක මුදල් බෙදගෙන තිබේ. අත්අඩංගුවට ගන්නා අවස්ථාව වනවිට ඔවුන් එම සියලු මුදල් වියදම් කර තිබුණු බව පොලිසිය පවසයි. මහනුවර, වත්තේගම හා කුරුණෑගල ප්‍රදේශයේ පදිංචි සැකකරුවන් සම්බන්ධයෙන් සිදුකළ වැඩිදුර විමර්ශන වලදී ඔවුන් දිවයිනේ ප්‍රදේශ ගණනාවකම මේ ආකාරයෙන් ඉඩම් අලෙවි කර තිබෙන බව හෙළිව ඇත.

# අහංගම කසිප්පු අල්ලන්න ගිය පොලිස් නිලධාරීන්ට පහරදීලා

■ එෆ්. අස්ලම්

අහංගම, පැලත්ත ප්‍රදේශයේ මහා පරිමාණ කසිප්පු ජාවාරමක් වැටලීමට ගිය අහංගම පොලිසියේ නිලධාරීන් පිරිසකට පහරදී පොලිස් ජීප් රියටද අලාභ හානි සිදුකළ කණ්ඩායමක පස් දෙනෙකු අහංගම පොලිසිය විසින් ඊයේ (23 වැනිද) අත්අඩංගුවට ගනු ලැබීය. මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ පැලත්ත ප්‍රදේශයේ මහා පරිමාණ කසිප්පු ජාවාරමක් පවත්වාගෙන ගිය පැටියා නැමති ජාවාරම්කරු ඇතුළු එම ගම්මානයේම පස් දෙනෙකු බව අහංගම පොලිසිය පවසයි.

අහංගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නාලක ජයවීර වෙත ලද තොරතුරකට අනුව උප පොලිස් පරීක්ෂක චන්දන ඇතුළු නිලධාරීන් හත්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් පෙරේද (22 වැනිද) සවස අහංගම පැලැත්ත ප්‍රදේශයේ වැටලීම සිදුකර ඇත. පැටියා නැමැති පුද්ගලයා සමග රැඳී සිටි දස දෙනෙකුගෙන් යුත් පිරිසක් පොලිස් රාජකාරියට බාධා කර තිබේ. එහිදී ජාවාරම්කරුට හිතවත් පිරිස පොලිසියට පහරදී තිබුණි.



එතෙර අරුණ

# භාණ්ඩ ප්‍රවාහනයටත් යොදා ගන්න යයි



# ට්‍රැෆික් මගහැර අහසින් යන්න බ්‍රසීලයේ ගුවන් ටැක්සි

## ඇමරිකාව ජපානය සහ චීනයේත් අත්හදා බැලීම්

■ නිහාල් පීරිස්



ලෝකයේ බොහෝ රටවලට විශාල ගැටලුවක් වී ඇති මාර්ග තදබදයට විසඳුමක් ලෙස ගුවන් ටැක්සි (Air Taxi) හඳුන්වාදීමට බ්‍රසීලය සූදනම් වන බව විදෙස් මාධ්‍ය වාර්තා කරයි. බ්‍රසීලය එලෙස සූදනම් වන්නේ ඇමරිකාව, ජපානය සහ චීනය නුදුරු අනාගතයේ මෙවැනි ගුවන් ටැක්සි සේවා හඳුන්වාදීම සඳහා දැනටමත් අත්හදබැලීම් කරමින් සිටින පසුබිමකය. බ්‍රසීලයේ ගුවන් යානා නිෂ්පාදන සමාගමක් වන එම්බ්‍රියර් (Embraer) සමාගම එරට සාඕ පාවුලෝ නගරය ආසන්නයේ මෙවැනි ගුවන් ටැක්සි කර්මාන්ත ශාලාවක් ඉදි කිරීමට සූදනම් වන බව වාර්තා වේ. 2026 වනවිට මෙම ගුවන් ටැක්සි භාවිතයට ගැනීම ඔවුන්ගේ අපේක්ෂාවය. මෙවැනි සේවා නිසා ඉදිරියේ දී මුදල් හදල් ඇති අයට මහ මග ඇති වාහන තදබදය මගහැර තම රැකියා සහ වෙනත් කටයුතු සඳහා අහසින් ගමන් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

මේවා සම්පූර්ණයෙන්ම විදුලි බලයෙන් ක්‍රියා කරන (Electric) යානා නිසා ඒවායින් පරිසර හානියක් සිදු වන්නේ ද නැත. මෙම ටැක්සි කුඩා හෙලිකොප්ටරයක හෝ විශාල ඩ්‍රෝන යානාවක ස්වරූපය ගනු ඇති අතර එකවර මගීන් සය දෙනෙකුට ගමන් කළ හැකි වනු ඇතැයි පැවසේ. එක් ගමන් වාරයක් සඳහා එක් මගියකුගෙන් අය කරන ගාස්තුව ඇමරිකානු ඩොලර් 50ත් 100ත් අතර වනු ඇති බවද අපේක්ෂා කෙරේ. එය ලංකා රුපියල්වලින් 16,000ත් 32,000ත් අතර ගාස්තුවකි. ඉහත කී එම්බ්‍රියර් සමාගම පවසන්නේ දැනටමත් මෙවැනි ටැක්සි 3,000ක් සඳහා ඇණවුම් ලැබී ඇති බවයි. ගුවන් ටැක්සියේ පළමු ආකෘතිය වසරක් ඇතුළත නිෂ්පාදනය කිරීමටද ඔවුහු බලාපොරොත්තු වෙති.

ඇමරිකාව 2025 වසර වනවිට මෙවැනි ගුවන් ටැක්සි සේවා ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව පසුගිය දිනවල වාර්තා වී තිබිණි. ජපානයද මෙවැනි අදහසක සිටින බව සඳහන් වේ. එක්ස්පෝ 2025 නැමැති දැවැන්ත ජාත්‍යන්තර ප්‍රදර්ශනයක් එම වසරේ ජපානයේ පැවැත්වීමට නියමිතව තිබේ. එය පැවැත්වීමට සැලසුම් කර ඇත්තේ කෘත්‍රිමව ඉදි කළ දූපතකය. රටේ විවිධ තැන්වල සිට මෙම ප්‍රදර්ශන භූමිය වෙත මගීන් ප්‍රවාහනය කිරීමට මෙවැනි ගුවන් ටැක්සිද යෙදවීමට ජපානය අදහස් කරයි. එයද ප්‍රදර්ශනයේ ප්‍රධානම සහ ආකර්ශණීයම අංගයක් වනු ඇති බව සංවිධායකයෝ පවසති. ගුවන් ටැක්සියක ගමන් කිරීම ප්‍රදර්ශනය නැරැඹීම සඳහා පැමිණෙන්නන්ට අපූරු, නැවුම් අත්දැකීමක් වනු ඇති බව අමුතුවෙන් කිව යුතු නොවේ.



මෙවැනි ගුවන් ටැක්සිවල ඇති විශේෂත්වයක් වන්නේ ඒවාට එක තැන සිරස්ව අහසට නැගීමට සහ නැවත පොළොවට බැසීමට හැකි වීමයි. ඒ නිසා සාමාන්‍ය ගුවන් යානාවලට අවශ්‍ය වන ආකාරයේ විශාල ගුවන් තොටුපොළවල් මේවාට අවශ්‍ය නොවේ. කෙසේ නමුත් අනාගතයේ මෙවැනි ගුවන් ටැක්සි භාවිතයට එන අවස්ථාව වනවිට නගරවල විවිධ ස්ථානවල මේවාට අවශ්‍ය වන කුඩා ගුවන් තොටුපල විශාල සංඛ්‍යාවක් ඉදි කිරීමට සිදුවනු ඇත. නගරවල විවිධ තැන්වලට යෑමට අවශ්‍ය වන මගීන් මෙම ගුවන් ටැක්සිවල ගමන් කරනු ඇති බැවිනි. මෙවැනි කුඩා ගුවන් තොටුපළ හැඳින්වීම සඳහා ස්කයිපෝර්ට් (Skyport) යන වදන භාවිත කරනු දැකිය හැකි වේ. දැනට භාවිතයේ ඇති වාහන රථගාල්වල වහල මත මෙවැනි ගුවන් ටැක්සි තොටුපළවල් ඉදි කිරිම ගැන ඇමරිකාව සලකා බලමින් සිටින බව වාර්තා වේ.

මගීන් ප්‍රවාහනය සඳහා මෙන්ම භාණ්ඩ ප්‍රවාහනය සඳහා ද මෙවැනි ගුවන් ටැක්සි යොද ගැනීමට හැකියාව ලැබේ. කෙසේ නමුත් මෙවැනි ගුවන් ටැක්සි සේවාවලට අදළව බොහෝ ගැටලු තවමත් විසඳ ගැනීමට ඉතිරිව ඇති බව ද සඳහන් වේ. ඒ අතරින් ප්‍රධානම ගැටලු ලෙස සඳහන් වන්නේ ආරක්ෂාව සහ ගුවන් ගමන් පාලනය සම්බන්ධ ඒවාය. මෙවැනි ටැක්සි යානා ගමන් කරනු ඇත්තේ ඉතා ජනාකීර්ණ නගරවලට ඉහළිනි. යම් හෙයකින් එවැනි ටැක්සියක් කඩා වැටුණහොත් පොළොව මත සිටින්නවුන්ට සහ දේපළවලට විශාල හානි සිදුවනු ඇත. මේ නිසා මේවායේ ආරක්ෂිත බව සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කිරීමට ඒවා නිෂ්පාදනය කරන පාර්ශ්ව පියවර ගෙන තිබේ. එමෙන්ම මෙවැනි ටැක්සි විශාල සංඛ්‍යාවක් භාවිතයට එද්දී ඒවා අතර අනතුරු සිදුවීම වැළැක්වීම සඳහා ඉතා විධිමත් ගුවන් ගමන් පාලන ක්‍රමවේදයක් ද සැලසුම් කිරීමට සිදු වේ. මේවා ගැන මේ පිළිබඳ විශේෂඥයෝ දැඩි අවධානය යොමු කරමින් සිටිති.

## එක් ගමන් වාරයකදී හය දෙනෙකුට යන්න පුළුවන්



## රථ ගාල්වල වහලය මත ගුවන් ටැක්සි තොටුපොළවල්

---

# මාරක ළිඳෙන් අවසන් වූ සැණකෙළියේ රාජකාරිය



මාරක ළිඳේ අනතුර සිදු වූ ස්ථානය

■ මහින්ද සේනාරත්න
- කන්තලේ



මියගිය සැරයන් ජානක සුරංජීව

"හවස සැණකෙළියේ රාජකාරියට ගිය මහත්තයා වැටිලා රෝහලට අරන් ගියා කියලා මහ රෑ පණිවුඩයක් ආවා. ඊට පස්සේ රෝහලට ගිහින් බැලුවාම තමයි දැනගත්තේ මහත්තයා නැතිවෙලා කියලා. මෙලෙස කියා සිටියේ කන්තලේ පැවැති සැණකෙළියේ දී මාරක ළිඳේ නරඹන්නන් රැඳී සිටි තට්ටුව කඩා වැටීමෙන් මියගිය පොලිස් සැරයන්ගේ බිරිය වන එච්.ජී. තුෂාරි සංජීවනී (43) ය.

කන්තලේ මධ්‍ය මහා විද්‍යාලීය ක්‍රීඩාංගණයේ දී දින හතක් පුරා පැවැත්වීමට නියමිතව තිබූ සැණකෙළියේ හතරවැනිද රාත්‍රියේ දී සිදු වූ හදිසි අනතුරකින් මෙලෙස මියගොස් ඇත්තේ කන්තලේ පොලිසියේ සැරයන්වරයකු ලෙසට රාජකාරියේ නියැළි සිටි ලයිට්පාර ප්‍රදේශයේ පදිංචි ජේ.එම්. ජානක සුරංජීව නම් දෙදරු පියෙකි.

පශ්චාත් මරණ පරීක්ෂණයේ දී මියගිය අයගේ බිරිඳ වැඩි දුරටත් මෙසේ පැවසුවාය.

"එද හවස 5. 30ට පමණ මහත්තයා රාජකාරියට යනවා කියලා ගෙදරින් පිටත් වුණේ. රෑ එකොළහාමාරත් පහු වුණාට පස්සේ මහත්තයාගේ මල්ලි පදිංචි වෙලා ඉන්න අල්ලපු ගෙදර සද්දෙට කට්ටියක් කතා කරනවා ඇහිලා මමත් එතනට ගියා. ඒ ඇවිත් තිබුණේ අපේ බාප්පාගේ දුවයි එයාගේ මහත්තයායි. එයාලා කිවුවා මගේ මහත්තයා රාජකාරියේ ඉන්නකොට වැටිලා රෝහලට අරන් ගියා කියලා. බරපතළ බවක් කිවුවේ නෑ. මමත් ඉක්මනට රෝහලට යනකොට මහත්තයා හදිසි ප්‍රතිකාර ඒකකයේ හිටියේ. ටික වෙලාවකට පස්සේ කිවුවා මහත්තයා මිය ගිහින් කියලා.

**පොළොවේ සිට අඩි විස්සක් පමණ උසකින් මාරක ළිඳ වටා නරඹන්නන් හට රැඳී සිටීමට තට්ටුව සකසා තිබුණේ යකඩ රාමුවක් සහිත අඩි 8 - 4 යකඩ තහඩුවලිනි. ඒ වන විටත් නරඹන්නන් පහළොස් දෙනෙකු පමණ මෙම තට්ටුවේ රැඳී සිට තිබිණි. සැරයන්වරයා එහි එක් තහඩුවක් මත සිට ඇති අතර එක්වරම එම තහඩුව රැඳවුම්වලින් ගැලවී එහි සමතුලිත භාවය නොමැති වී ඔහුව බිමට වැටී පහළ තිබූ ලී ඉනිමගක හිස වැදී ඇත.**

මෙම අනතුර සිදුව ඇත්තේ මාරක ළිඳේ සංදර්ශනයක් පැවැත්වෙන අවස්ථාවේය. පොළොවේ සිට අඩි විස්සක් පමණ උසකින් මාරක ළිඳ වටා නරඹන්නන් හට රැඳී සිටීමට තට්ටුව සකසා තිබුණේ යකඩ රාමුවක් සහිත අඩි 8- 4 යකඩ තහඩුවලිනි. ඒ වන විටත් නරඹන්නන් පහළොස් දෙනෙකු පමණ මෙම තට්ටුවේ රැඳී සිට තිබිණි. සැරයන්වරයා එහි එක් තහඩුවක් මත සිට ඇති අතර එක්වරම එම තහඩුව රැඳවුම්වලින් ගැලවී එහි සමතුලිත භාවය නොමැති වී ඔහුව බිමට වැටී පහළ තිබූ ලී ඉනිමගක හිස වැදී ඇත. පසුව ඉහළ තිබූ යකඩ තහඩුව ද රැඳවුමෙන් ගැලවී ඔහුගේ සිරුර මතට වැටීමෙන් සැරයන්වරයා බරපතළ තුවාල ලැබූ බව සිදුවීම දුටුවෝ පැවසූහ. මේ පිළිබඳව පොලිසිය විසින් කන්තලේ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කළේය.

කන්තලේ අධිකරණ වෛද්‍ය නිලධාරී පී.පී. දෙල්ගහගොඩ සඳහන් කළේ මොළයට, බෙල්ලට සහ පපු ප්‍රදේශයට දැඩි හානි සිදුවීමෙන් මෙම මරණය සිදුව ඇති බවයි. මියගිය සැරයන්වරයාගේ අවසන් කටයුතු පොලිස් ගෞරව මැද කන්තලේ පොදු සුසාන භූමියේ දී ඊයේ (23) සිදු කෙරිණි.

කෙසේ වුවද සිදුවූ අනතුර හේතුවෙන් සතියක් පුරාවට පැවැත්වීමට නියමිතව තිබූ සැණකෙළිය අත්හිටුවා ඇති අතර සංදර්ශන භූමියේ සවිකර තිබූ මාරක ළිඳ හැරෙන්නට අනෙකුත් විනෝද ක්‍රීඩා උපකරණ සහ යන්ත්‍ර ගලවා ඉවත් කරගෙන ගොස් තිබිණි.

